වාර්ෂික වාර්තාව - 2016

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# වාර්ෂික වාර්තාව - 2016

## පටුන


ගරු සභාපතිතුමාගේ පණිවුඩය

| | | |
|---|---|---|
| **(01)** | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 01 - 14 |
| **(02)** | විගණකාධිපති වාර්තාව | 15 - 39 |
| **(03)** | ගිණුම් ප්‍රතිපත්ති | 40 - 44 |
| **(04)** | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 45 |
| **(05)** | නිෂ්පාදන වෙළඳ හා ලාභා'ලාභ ගිණුම | 46 - 47 |
| **(06)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 48 |
| **(07)** | ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය | 49 |
| **(08)** | ගිණුම් පිළිබඳ සටහන් | 50 - 51 |


**සභාපතිතුමාගේ පණිවිඩය,**

වසර 47ක දීර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේද ආයුර්වේද නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස වෙළඳපල ජයගැනීමට 2016 වර්ෂයේදී අප විසින් කටයුතු කරන ලදි. ඒ සඳහා 2015 වසර අග ගරු ජනාධිපතිතුමා විසින් විවෘත කළ නව නිෂ්පාදනාගාරය පෞද්ගලික අංශයේ අලෙවිය වර්ධනය කිරීමට අවශ්‍ය නිෂ්පාදන කටයුතු සඳහා පූර්ණකාලීන වශයෙන් යොදා ගන්නා ලදි.

2016 වසර අගභාගයේදී අනේක විධ ගැටළු මධ්‍ය යේ වුවද 2015 වසරට සාපේක්ෂව 8%ක අලෙවි වර්ධනයක් ළඟා කර ගැනීමට හැකිවීම අප ලද තවත් ජයග්‍රහණයකි.

තවද වෙළඳපල තරඟකාරිත්වයට මුහුණ දීම සඳහා නිෂ්පාදනයේ ප්‍රමිතිය ඉහළ දැමීමට කටයුතු කිරීම පමණක් නොව, වෙළඳපල ආකර්ශණය කර ගැනීම සඳහා පැවති ගතානුගතික ඇසුරුම් වර්තමානයට ගැලපෙන අයුරින් වෙනස් කිරීමට කටයුතු කරන ලදි.

රාජ්‍ය අංශයේ ඉල්ලුම ඒ ආකාරයෙන්ම සපුරාලීම සඳහා පවතින යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණවත් නොවන බැවින්, මහා භාණ්ඩාගාරය මෙන්ම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහයෝගය මත ගන්නා ලද ප්‍රතිපාදන මඟින් නවීන ලෝකයට ගැලපෙන අයුරින් නව යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට අපට හැකියාව ලැබුණි. ඒ තුළින් දූප්පත් පොහොසත් භේදයකින් තොරව ගිලනුන් සුවපත් කිරීම සඳහා මහඟු කාර්යයක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් සිදුකර ඇත.



ලාල් සමරසිංහ

සභාපති

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2016 වර්ෂය

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2016.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව දේශීය වෛද්‍ය ගරු ඇමතිතුමා වෙත ගෞරවයෙන් පිළිගන්වමි.

## (01) හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් එවකට සිටි කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කරන ලදී.

## (02) දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කරගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කරගත් පුරෝගාමී ආයතනයක් වීම.

## (03) මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරලමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

## (04) ප්‍රධාන අරමුණු

**01.** ආයුර්වේද ඖෂධ වර්ග භෛසජ්‍ය ද්‍රව්‍ය සහ සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.

**02.** අත්‍යවශ්‍ය ආයුර්වේද, සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ යන දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.

**03.** දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.

**04.** ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.

**05.** ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.

**06.** ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වා ගෙන යාම.

**07.** ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

## (05) <u>ව්‍යාපාර ස්ථාන</u>

### 5.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

මහරගම නාවින්න පාරේ අංක 94 දරණ ස්ථානයේ පිහිටා ඇත.

### 5.2 අලෙවි මධ්‍යස්ථාන

| | |
|---|---|
| විජේරාම (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ. |
| මහනුවර (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 70, යටිනුවර වීදිය, මහනුවර. |
| දියතලාව | : සනානි මන්දිරය, දියතලාව |
| අනුරාධපුරය | : අංක 414/2, සිරිමෙවන් මාවත, දෙවන පටුමඟ, අනුරාධපුරය. |
| බදුල්ල | : බී 35/36, පළමු මහල, බස්නැවතුම්පොළ, බදුල්ල. |
| කොටුව | : කොටුව දුම්රිය ස්ථානය, 2 වන වේදිකාව, කොටුව. |
| නාවින්න | : අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම. |
| රත්නපුර | : අංක 32, බස්නැවතුම්පොල පාර , රත්නපුර. |
| තංගල්ල | : අංක 23, මුහුදු මාවත, තංගල්ල |
| මාතර | : අංක 43, පරණ තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර. |
| යාපනය | : අංක 169 , කේ.කේ.එස් පාර, යාපනය. |
| ගාල්ල | : අංක 38 ,ඕල්කට් මාවත, (දංගෙදර වීදිය) ගාල්ල. |
| සෙත්සිරිපාය | : සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| මොණරාගල | : අංක 267, වැල්ලවාය පාර, මොණරාගල. |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| බොරැල්ල | : ආයුර්වේද ජාතික ශික්ෂණ රෝහල |

## (06) අධ්‍යක්ෂ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | කීර්ති ලාල් සමරසිංහ මහතා | - | සභාපති |
| 2. | සඳරුවන් ලංකේෂ්වර මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂ |
| 3. | එෆ්.එම්.එන්.ආර්.අබේවර්ධන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 4. | වෛද්‍ය ඩබ්.කේ.දයානන්ද මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | එච්.වයි. පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | ආර්. රුෂාන්දන් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 8. | ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දරන් | - | භාණ්ඩාගාර නියෝජිත |

## (07) විධායක නිලධාරි මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති | - | කීර්ති ලාල් සමරසිංහ මහතා |
| 2. | කළමනාකාර අධ්‍යක්ෂ | - | සඳරුවන් ලංකේෂ්වර මහතා |
| 3. | සාමාන්‍යාධිකාරි<br>(2015.04.01 – 2016.11.25) | - | ඒම්.ජේ.මාරසිංහ මහතා |
| 4. | සාමාන්‍යාධිකාරි<br>(2016.11.28 – 2017.02.06) | - | එස්.ඒ.ඩී.එම්.පී. ගුණසේකර මහතා |
| 5. | සහකාර සාමාන්‍යාධිකාරි (කර්මාන්තශාලා) | - | කේ.ඩී.එම්. අර්ජුන චන්ද්‍රසේකර මහතා |
| 6. | සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) | - | ගයත්‍රි හේරත් මෙනවිය |
| 7. | සහකාර සාමාන්‍යාධිකාරි (අලෙවි) | - | අනෝමා ප්‍රේමරත්න මෙනවිය |
| 8. | ප්‍රධාන වෛද්‍ය නිලධාරී (වැ.බ) | - | සෝමා නාමසිංහ මිය |
| 9. | වෛද්‍ය නිළධාරී | - | එම්.කේ.එන්. ගුණසේකර මිය |
| 10. | වෛද්‍ය නිළධාරී | - | කේ.ඒ.සි.ඩී. කොඩිකාර මිය |
| 11. | අලෙවි කළමනාකරු | - | බී.එස්. කාරියවසම් මහතා |
| 12. | කළමනාකරු මානව සම්පත් | - | ලංකා වරකාගොඩ මෙනවිය |
| 13. | කළමනාකරු මුදල් | - | කැලුම් පතිරවසම් මහතා |
| 14. | වෛද්‍ය නිළධාරී | - | ඕෂධි පතිරණ මිය |

15. කළමනාකරු තත්ත්ව පාලන - ඒම්.ඒ.ඩී.ඩී.සී. මන්ත්‍රිරත්න මෙනවිය

16. කළමනාකරු - සැපයුම් - කේ.ඒ.ජේ.රෝහාන් රාජ් පෙරේරා මහතා
(2016.01.01 – 2016.12.31 දක්වා)

17. ගණකාධිකාරී - ඒ.ඩී.එස්. ප්‍රේමසිංහ මිය

<u>අභ්‍යන්තර විගණන අංශය</u>

1. අභ්‍යන්තර විගණක - මධුෂිකා චන්ද්‍රවංශ මිය

## (08) කාර්ය මණ්ඩල සංයුතිය

2016 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

| තනතුරු නාමය | කාර්යාලය | නිෂ්පාදනාගාරය | විජේරාම අ.ම | නාවින්න අ.ම | මහනුවර අ.ම | දියතලාව අ.ම | බදුල්ල අ.ම | අනුරාධපුරය අ.ම | පිටකොටුව අ.ම | තංගල්ල අ.ම | රත්නපුර අ.ම | මොණරාගල අ.ම | ගාල්ල අ.ම | බොරැල්ල අ.ම | මාතර අ.ම | යාපනය අ.ම | පොත්ශිටියාය අ.ම | නිකවැරටිය ඔසු උයන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | 1 | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | - | 2 |
| කළමනාකරුවන් | 5 | 4 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | - | 9 |
| කනිෂ්ඨ කළමනාකරුවන් | 11 | 2 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | - | 13 |
| කළමනාකාර සහකාර සේවා තාක්ෂණික නිලධාරීන් | - | 10 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | - | 10 |
| කළමනාකාර සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන් | 48 | 10 | 1 | 1 | 1 | 1 | 1 | - | | 1 | 1 | - | - | 1 | 1 | - | | 1 | 68 |
| ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය නිලධාරීන් | | 12 | | | | | | | | | | | | | | | | | 12 |
| ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නිලධාරීන් | | 11 | | | | | | | | | | | | | | | | | 11 |
| ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන නිලධාරීන් | 22 | 97 | 2 | 2 | 1 | 1 | 1 | 3 | 1 | | 1 | 1 | 3 | - | 1 | 1 | 2 | 1 | 140 |
| කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් | 26 | 24 | - | - | - | - | | | | | | | | 1 | | 1 | | | 52 |
| අනියම් කම්කරු / තාවකාලික කම්කරු | | 6 | | | | | | | | | | 1 | | | | | | | 7 |
| එකතුව | 113 | 177 | 3 | 3 | 2 | 2 | 2 | 3 | 1 | 1 | 2 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 324 |

## (09) සේවක දිරි දීමනා සහ සුබසාධනය

### සේවක දිරි ගැන්වීම්

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පහත සඳහන් දීමනා ලබා දෙනු ලැබේ.

- පැමිණීමේ දිරි දීමනාව
- නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව
- ඵලදායීතා දීමනාව (නිෂ්පාදනාගාර සේවකයන් සඳහා)
- වාර්ෂිකව ප්‍රසාද දීමනා
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම් කිරීම

### සේවක සුභසාධනය

අප සංස්ථාවේ සේවක සුභසාධනය සඳහා පහත සඳහන් වැඩ පිලිවෙළ දැනට ක්‍රියාත්මකව ඇත.

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඍජුව සම්බන්ධ වන සියළුම සේවකයින් හා අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.
- සියළුම සේවකයින්ට උදෑසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දිම
- සංස්ථාවේ සියළුම කාර්යමණ්ඩලයට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා තෙදිනක වාර්ෂික විනෝද චාරිකාවක් යාමට සංස්ථාවේ අනුග්‍රාහකත්වය ලබා දී ඇත
- අවමංගල්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම ඇතුළුව අනෙකුත් පහසුකම් ලබා දීම
- අප්‍රේල් මස අවුරුදු උත්සවය සඳහා රු.5,500ක තෑගි වවුචර් පත්‍රයක් සියළුම සේවකයින්ට ලබා දීම

**(10) ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.**

| | ඖෂධ නාමය | ඒකකය | 2016 වර්ෂය | 2015 වර්ෂය | 2014 වර්ෂය | 2013 වර්ෂය | 2012 වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| 1 | අරිෂ්ට/වයින් | මි.ලී.750 | 99,917 | 152,594 | 149,196 | 130,960 | 145,552 |
| 2 | ආසව | මි.ලී.750 | 97,074 | 121,840 | 105,860 | 142,933 | 112,948 |
| 3 | ක්වාථ | මි.ලී.750 | 78,865 | 51,795 | 80,247 | 60,393 | 45,945 |
| 4 | සිරප් | මි.ලී.750 | 23,184 | 17,580 | 18,573 | 17,769 | 20,140 |
| 5 | තෛල | මි.ලී.750 | 106,861 | 170,067 | 171,392 | 163,484 | 139,847 |
| 6 | චූර්ණ | කි.ග්‍රෑ. | 21,972 | 28,756 | 24,942 | 29,225 | 45,945 |
| 7 | කල්ක/ලේහ/ලේප | කි.ග්‍රෑ. | 17,407 | 20,491 | 18,360 | 22,173 | 19,945 |
| 8 | රස | කි.ග්‍රෑ. | 3,423 | 2,942 | 2,505 | 3,122 | 1,417 |
| 9 | වටිකා/ගුගුල් | කි.ග්‍රෑ. | 11,822 | 11,696 | 10,166 | 15,233 | 9,651 |
| **10** | **නව නිෂ්පාදන 01** | | | | | | |
| | (1) රණහංස රසායනය | කි.ග්‍රෑ. | - | - | - | 139 | 412 |
| | (2) ත්‍රිඵලා පෙති | කි.ග්‍රෑ. | 1,459 | 937 | 988 | 710 | 500 |
| | (3) මේදහරණී පෙති | කි.ග්‍රෑ. | 692 | 840 | 808 | 457 | 191 |
| | (4) මධුරු ධූපය | කි.ග්‍රෑ. | - | - | - | | |
| | (5) සුපේෂී බාම් | කි.ග්‍රෑ. | - | 21 | 21 | 11 | 27 |
| | (6) ජීවාලේප බාම් | කි.ග්‍රෑ. | 542 | 513 | - | | |
| | (6) මධුමේහහරණී පෙති | කි.ග්‍රෑ. | - | - | - | | |
| **11** | **නව නිෂ්පාදන** | | | | | | |
| | (1) තැම්බුම් හොදි | ග්‍රෑ. 05 | 80,600 | 158,560 | 226 | 151,893 | 103,680 |
| | තැම්බුම් හොදි | ග්‍රෑ. 250 | - | - | - | | 1 |
| | (2) පේයාව | ග්‍රෑ. 05 | 282,200 | 274,328 | 219,784 | 245,785 | 147,313 |
| | පේයාව | ග්‍රෑ. 250 | - | - | 10 | | 1 |
| | (3) පස් පංගුව | ග්‍රෑ. 50 | 29,889 | 36,742 | 70,556 | 44,671 | 67,924 |
| | (4) කෝමාරිකා ෂැම්පූ | මි.ලී.95 | 16,408 | 21,344 | 11,802 | 723 | 8,626 |
| | (5) ඉරමුසු කුඩු | කි.ග්‍රෑ. | - | - | - | | 338 |
| | (6) බෙලිගැට මද කුඩු | කි.ග්‍රෑ. | - | - | - | | 560 |
| | (7) WENIWEL BODY WASH | ලී. | 10 | | | | |
| | WENIWEL BODY WASH | මි.ලී.300 | 22,935 | 10,336 | | | |
| | WENIWEL BODY WASH | මි.ලී.100 | 11,845 | | | | |
| | WENIWEL BODY WASH | මි.ලී.65 | 12,551 | | | | |
| | WENIWEL BODY WASH | මි.ලී.60 | 12,295 | 16,977 | | | |
| | (8) IRAMUSU HERBAL (TEA BAG) 2.5g | BAG | 9,116 | | | | |
| | (9) CINNAMON HERBAL TEA (NEW) 01 | BAG | 12,790 | | | | |
| | (10) CINNAMON CAPSULES 60 Nos | 60Nos | 3,290 | | | | |
| | (11) ALOE VERA HERBAL DRINK | මි.ලී.200 | 669 | | | | |
| | (12) NELLI HERBAL DRINK | මි.ලී.200 | 508 | | | | |
| | (13) CUCUMBER FACIAL WASH | මි.ලී.100 | 3,116 | | | | |
| | CUCUMBER FACIAL WASH | මි.ලී.50 | 4,781 | | | | |
| | (14) PAPAYA FACIAL WASH | මි.ලී.100 | 3,047 | | | | |
| | PAPAYA FACIAL WASH | මි.ලී.50 | 3,502 | | | | |
| | (15) SANDALWOOD FACIAL WASH | මි.ලී.100 | 18,485 | | | | |
| | SANDALWOOD FACIAL WASH | මි.ලී.50 | 14,053 | | | | |
| | වෙනත් නිෂ්පාදන වර්ග | | | | | | |
| | (1) ANTI DIABETIC HERBLE TEA 25 BAGS | පෙට්ටි | - | | - | | 32 |
| | (2) HERBLE CURRY SOUP 5g (EEPORT) | 5g | - | | - | | 500 |
| | (3) MIXE HERBLE TEA 1.5g /06 BAGS (EXPORT) | Nos | - | 13,990 | 3,200 | | 4,320 |
| | (4) SPICY HERBLE TEA 5g (EXPORT) | 5g | - | | - | | 500 |
| | (5) PANTA KASAYA 60g | කි.ග්‍රෑ. | - | | - | | 141 |
| | (6) OUSHADHA MANJUSA (FINISH GOOD) | පෙට්ටි | - | 17 | | | |

**(11) රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ.**

(රු. දස ලක්ෂ වලින්)

| | 2016 වර්ෂය | 2015 වර්ෂය | 2014 වර්ෂය | 2013 වර්ෂය | 2012 වර්ෂය | 2011 වර්ෂය |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය අංශය | 450.07 | 414.35 | 340.45 | 336.49 | 315.98 | 294.76 |
| <u>අලෙවි මධ්‍යස්ථානය</u> | | | | | | |
| විජේරාම වෙද ගෙදර | 8.44 | 12.27 | 13.30 | 10.59 | 6.54 | 6.36 |
| ජංගම අලෙවිය | 20.74 | 4.42 | 0.97 | 0.33 | 0.12 | 0.27 |
| මහනුවර අලෙවි මධ්‍යස්ථානය | 7.18 | 7.52 | 7.96 | 6.22 | 6.53 | 5.37 |
| දියතලාව අලෙවි මධ්‍යස්ථානය | 3.53 | 4.44 | 5.12 | 3.05 | 3.33 | 1.94 |
| අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය | 5.15 | 3.77 | 3.81 | 2.00 | 1.85 | 0.98 |
| බදුල්ල අලෙවි මධ්‍යස්ථානය | 3.87 | 3.41 | 3.27 | 2.94 | 2.65 | 1.77 |
| පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය | 4.85 | 2.22 | - | 2.22 | 4.15 | 3.66 |
| නාවින්න අලෙවි මධ්‍යස්ථානය | 14.58 | 14.79 | 13.82 | 12.86 | 9.78 | 9.28 |
| අංක 008 ගබඩාව | 9.25 | 10.07 | 17.34 | 19.86 | 23.54 | 20.38 |
| රත්නපුර අලෙවි මධ්‍යස්ථානය | 9.32 | 19.53 | 18.01 | 12.46 | 9.39 | 4.74 |
| තංගල්ල අලෙවි මධ්‍යස්ථානය | 1.63 | 3.91 | 2.84 | 2.09 | 1.25 | 2.17 |
| විභාග දෙපාර්තමේන්තුව අලෙවි මධ්‍යස්ථානය | - | - | - | 0.98 | 1.02 | 1.01 |
| යාපනය අලෙවි මධ්‍යස්ථානය | 8.05 | 4.3 | 4.17 | 4.53 | 2.89 | 2.07 |
| ගාල්ල අලෙවි මධ්‍යස්ථානය | 5.12 | 8.02 | 7.93 | 5.58 | 4.65 | 3.68 |
| සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය | 3.37 | 1.94 | 1.71 | 1.67 | 1.20 | 0.21 |
| ජනකලා කේන්ද්‍රය | - | - | 0.002 | 0.31 | 0.60 | 0.03 |
| මොණරාගල අලෙවි මධ්‍යස්ථානය | 1.93 | 1.24 | 1.42 | 1.27 | 0.74 | |
| බත්තරමුල්ල අලෙවි මධ්‍යස්ථානය | - | 0.70 | 1.17 | | | |
| වේරහැර අලෙවි මධ්‍යස්ථානය | - | 1.61 | 1.04 | | | |
| පාවෙන වෙළඳසැල අලෙවි මධ්‍යස්ථානය | - | 0.23 | 0.61 | | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අලෙවි මධ්‍යස්ථානය | 0.47 | 1.15 | | | | |
| නිකවැරටිය අලෙවි මධ්‍යස්ථානය | 3.10 | | | | | |
| මාතර අලෙවි මධ්‍යස්ථානය | 3.73 | | | | | |
| බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය | 2.01 | | | | | |
| **මුළු එකතුව** | **566.39** | **519.89** | **444.94** | **425.45** | **396.21** | **358.68** |

**(12) ආදායම බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)**

| | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|---|
| විකුණුම් | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 |
| අඩු කළා :- විකුණුම් පිරිවැය | 58.42 | 54.76 | 68.52 | 62.46 | 61.81 | 56.13 |
| දළ ලාභය | 41.58 | 45.24 | 31.48 | 37.54 | 38.19 | 43.87 |
| එකතු කළා - වෙනත් ආදායම් | 0.01 | 1.15 | 2.34 | 2.08 | 4.68 | 4.28 |
| එකතුව | 41.59 | 46.39 | 33.82 | 39.62 | 42.87 | 48.15 |
| අඩු කළා | | | | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 22.05 | 21.65 | 18.50 | 18.29 | 19.56 | 21.81 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 11.42 | 11.98 | 10.91 | 11.65 | 9.03 | 8.60 |
| මූල්‍ය වියදම් | 1.55 | 1.62 | 1.98 | 0.64 | 0.01 | 0.10 |
| වෙනත් වියදම් | - | - | - | - | 0.62 | - |
| **මුළු වියදම** | 35.02 | 35.25 | 31.39 | 30.58 | 29.22 | 30.51 |
| **මෙහෙයුම් ලාභය** | 6.57 | 11.14 | 2.43 | 9.04 | 13.65 | 17.64 |
| එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම් | 0.74 | 0.82 | 1.23 | 1.31 | 3.75 | 0.55 |
| බදු අඩු කිරීමට පෙර ලාභය | 7.31 | 11.96 | 3.66 | 10.35 | 17.40 | 18.19 |
| **අඩු කළා** | | | | | | |
| නිකවැරටිය ඔසු උයන අලාභය | 0.73 | 1.03 | 0.4 | 0.43 | 0.45 | 0.37 |
| **අඩු කළා** | | | | | | |
| බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන | 2.27 | 4.06 | 1.46 | 2.65 | 4.74 | 5.16 |
| **ශුද්ධ ලාභය** | **4.31** | **6.87** | **1.80** | **7.27** | **12.21** | **12.66** |

**(13)** <u>ලාභ දායකත්වය (රු. මිලියන වලින්)</u>

| | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|---|
| විකුණුම් | 566.36 | 519.89 | 444.94 | 425.45 | 396.22 | 358.68 |
| අඩු කළා :- විකුණුම් පිරිවැය | 330.88 | 284.69 | 304.89 | 265.72 | 244.90 | 201.33 |
| දළ ලාභය | 235.48 | 235.2 | 140.05 | 159.73 | 151.32 | 157.35 |
| එකතු කළා - වෙනත් ආදායම් | 11.08 | 11.08 | 9.39 | 8.85 | 18.55 | 15.34 |
| මුළු ආදායම | 246.56 | 246.28 | 149.44 | 168.58 | 169.87 | 172.69 |
| <u>අඩු කළා</u> | | | | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 124.88 | 112.57 | 82.30 | 77.82 | 77.55 | 78.23 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 64.70 | 62.31 | 48.55 | 49.56 | 35.80 | 30.86 |
| මූල්‍ය වියදම් | 8.79 | 8.44 | 8.81 | 9.48 | 0.07 | 0.37 |
| වෙනත් වියදම් | - | - | - | - | 2.49 | - |
| **මුළු වියදම** | 198.37 | 183.32 | 139.66 | 136.86 | 115.91 | 109.46 |
| **මෙහෙයුම් ලාභය** | 48.19 | 62.96 | 9.78 | 31.72 | 53.96 | 63.23 |
| එකතු කළා - පොළී ආදායම් | 4.18 | 4.28 | 5.46 | 6.78 | 1.45 | 0.83 |
| මෙහෙයුම් නොවන ආදායම් | 0.18 | 0.25 | 1.01 | 5.59 | 13.44 | 1.15 |
| නිකවැරටිය ඔසු උයන (අලාභය) | (4.11) | (5.36) | (1.78) | (1.83) | (1.79) | (1.33) |
| බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන | (12.85) | (21.10) | (6.51) | (11.28) | (18.78) | (18.52) |
| **ශුද්ධ ලාභය** | **35.59** | **41.03** | **7.96** | **30.98** | **48.28** | **45.36** |

## (14) ඖෂධ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටළු

අප සංස්ථාවේ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී අමු ඖෂධ සපයා ගැනිම ඉතා දුෂ්කර කාර්යයක්ව පවතින අතර දේශීය සැපයුම්කරුවන්ගෙන් හා සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරන නිකවැරටිය රන්දෙනිගම හා මැදවච්චිය ඔසු උයන් වලින් මෙම ගැටළුවට තරමක විසඳුමක් ලබා ගැනීමට අපෙක්ෂා කරන අතර අනුරාධපුර ප්‍රදේශීය අමු ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කර ඇත.

## (15) සංස්ථාවේ නිෂ්පාදනාගාරය සහ ගබඩා පහසුකම් පුළුල් කිරීම

දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර බොහෝමයක් නව වෙළඳපලට හඳුන්වා දී ඇති බැවින් එම යන්ත්‍ර පිළිබඳව අධ්‍යයනයක් කර අප සංස්ථාවට ගැලපෙන යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන පතිරගොඩ නව නිෂ්පාදනාගාරයේ ස්ථාපිත කිරීමටත් ඒ තුළින් අපේක්ෂිත හා ඵලදායි නිෂ්පාදනයක් කිරීමට අපෙක්ෂා කෙරේ.

එම නිෂ්පාදන ගබඩා කිරීම සඳහා දැනට පතිරගොඩ නව නිෂ්පාදනාගාරයේ ගබඩා සංකීර්ණය භාවිතා කරන අතර, දැනට ඉදිවෙමින් පවතින සිව් මහල් ගබඩා සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු අවසන් වූ වහාම එම ගැටළුව විසඳා ගැනීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව උතුරු මැද, උතුර, නැගෙනහිර වැනි පළාත් වලට අවශ්‍ය කරන නිෂ්පාදන අනුරාධපුර ප්‍රාදේශීය ගබඩාවක් මඟින් ඖෂධ බෙදාහැරීමට ඉදිරියේදී සියලු කටයුතු සැලසුම් කර ඇත.

## (16) <u>විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම</u>

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 2016 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 08 ක් පවත්වා ඇති අතර, එහිදී විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම්ද, අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම්ද සාකච්ඡා කර එහි දක්වා ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකරනු ලැබේ.

මෙයට අමතරව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ රැස්වීම් මාස 03 කට වරක් පවත්වන අතර, එහිදි ද විගණන විමසුම් වලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතියද සලකා බලන ලදී.

2016 වර්ෂයේ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික මණ්ඩලයේ විස්තර පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| ආර්. රුෂාන්දන් මහතා | - | භාණ්ඩාගාර නියෝජිත | - | කමිටු සභාපති |
| එස්.එම්.එන්.ආර්.අබේවර්ධන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | කමිටු සාමාජික |
| වෛද්‍ය ඩබ්.කේ.දයානන්ද මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | කමිටු සාමාජික |
| එම්.එන්. මනෝදර මහතා | - | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ නියෝජිත | - | කමිටු සාමාජික |
| එස්.ඒ.ඩී.එන්. පෙරේරා මිය | - | රජයේ විගණන අධිකාරි | - | කමිටු නිරීක්ෂක |
| යූ. ජයරත්න මහතා | - | අභ්‍යන්තර විගණක | - | කැඳවුම්කරු/කමිටු ලේකම් |

## (17) මූල්‍ය කළමනාකරණය හා විගණන විමසුම් පිළිබඳ අදහස්

සංස්ථාවේ ගිණුම් පද්ධතිය තුළ පවතින විවිධ අඩුපාඩු හා පද්ධති දුර්වලතා පිළිබඳව විගණකාධිපති විසින් වරින් වර විගණන විමසුම් වලින් පෙන්වා දෙනු ලැබේ. මෙයට අමතරව පාර්ලිමේන්තු පොදු කාරක සභාවේද එම අඩුපාඩු පෙන්වා දුන් අතර, දැනටමත් එම අඩුපාඩු හා දුර්වලතා විගණන හා කළමනාකරණ කමිටුව විසින් දෙනු ලබන උපදෙස් හා මඟපෙන්වීම අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි අවශ්‍ය නිවැරැදි කිරීම් කිරිමට 2016 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි.

ස්තුතියි.

- ❖ නිවැරදි මඟපෙන්වීමක් කළ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමාටත්, අනුර ජයවික්‍රම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ සංස්ථාවේ ප්‍රාග්ධන හා අයහාර වැඩිදියුණු කිරීම සඳහා සහාය දුන් මහාභාණ්ඩාගාරයටත්,
- ❖ නොමද සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත් ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත්පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- ❖ පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මඟපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමි.

(ලාල් සමරසිංහ)
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/සී/ඒඩීසී/1/16/46

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 පෙබරවාරි 22 දින

සභාපති,

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකි විය.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 මතය ව්‍යාචනය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

-------------------------------

ප්‍රමිතයේ 79 ඡේදය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට වූ රු.1,923,741 ක ප්‍රාග්ධන සංචිතයේ (capital reserve) හා රු.19,523 ක විදේශ විනිමය සැසඳුම් සංචිතයේ (foreign exchange reconciliation reserve) ස්වාභාවය හා පරමාර්ථ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

-----------------------------------

ප්‍රමිතයේ 81 ඡේදය ප්‍රකාරව, ආදායම් බදු වියදම හා ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.107,434,547 ක් වූ දේපල පිරියත හා උපකරණ තවදුරටත් සංස්ථාවේ කටයුතු සඳහා උපයෝජනය කරමින් පැවතියද වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

-----------------------------------

රජයේ ප්‍රදාන උපයෝගී කර ගෙන මිලදීගෙන තිබුණු වත්කම් වලින් ක්‍රමක්ෂය ගණනය කිරීමේදී රු. 30,410,557 ක් වටිනා වත්කම් අත්හැරීම හේතුවෙන් වර්ෂයේ ක්‍රමක්ෂය රු. 1,947,340 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

-----------------------------------

ප්‍රමිතයේ 17 ඡේදය ප්‍රකාරව, සංස්ථාවේ ඉහළ කළමනාකරණය වෙත ගෙවන කෙටිකාලීන සේවක ප්‍රතිලාභ, වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

-----------------------------------

(i) ප්‍රමිතයේ 9 ඡේදය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට රු.118,010,046 ක් වූ වෙළඳ ණයගැතියන්ගේ ක්‍රමක්ෂය වටිනාකම (amortized cost) මැනීමකින් තොරව රු.2,493,761 ක් බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 46 ඡේදය ප්‍රකාරව, සේවක ණය ක්‍රමක්ෂය වටිනාකම (amortized cost) මැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල පොලී අනුපාතය සඵල පොලී අනුපාතය ලෙස යොදාගත යුතු වුවත්, 2013, 2014 හා 2015 වර්ෂවලදී සඵල පොලී අනුපාතය ලෙස යොදාගත් සියයට 12 ක් වූ අනුපාතයම සාධාරණ හේතු හෙළිදරව් කිරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දිනට රු.17,243,428 ක් වූ සේවක ණය ක්‍රමක්ෂය වටිනාකම ගණනය සඳහා යොදා ගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.1,492,121 ක් වැයකර මිලදී ගෙන තිබුණු රාක්ක පද්ධතිය ප්‍රාග්ධනගත නොකර වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය රු.149,212 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. ඊට අමතරව තවත් ජංගම නොවන වත්කම් 03 ක වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය රු.55,625 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් මාසයේදී වැඩ නිමකර තිබුණු පතිරේගොඩ නව නිෂ්පාදනාගාරය නවීකරණය කිරීම සඳහා නොනිමි වැඩ ගිණුමට හර කර තිබුණු රු. 3,386,478 ක් සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ගිණුමට මාරු නොකිරීම හේතුවෙන් වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය රු.169,324 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) බැංකු ශේෂ සනාථ කිරීම්වලට අනුව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.311,523 ක් වුවද, එය රු.259,110 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට අලෙවි මධ්‍යස්ථාන 15 ක හා ගබඩා 02 ක පැවති භාවිතයට ගත නොහැකි හා කල් ඉකුත් වූ පිරිවැය රු.1,949,672 ක් වූ නිමි ඖෂධ තොගය ලාභයට එරෙහිව කපා නොහැර වර්ෂය අවසන් ඉතිරි තොගය තුළ ඇතුළත් කර තිබුණි.

(ඉ) ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී ලබා ගෙන තිබුණු රු.10,000,000 ක පොලී රහිත ණය මුදලෙන්, 2016 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු රු.8,755,000 ක් වූ ඉතිරි ණය ශේෂය ජංගම නොවන බැරකම් යටතේ

දිගුකාලීන ණය මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකර බාහිර දායකත්වයක් (external contributory) ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ණයට විකුණුම් ආදායම රු.17,236,388 ක් අඩුවෙන් හා ජංගම අලෙවි ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් වෙනස්කම් සඳහා පැහැදිලි කිරීම් ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම | ලෙජර් ගිණුම අනුව ශේෂය | උපලේඛන හෝ ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විකුණුම් | 566,362,580 | 568,227,975 | 1,865,395 |
| ලංකා බැංකු ස්ථාවර තැන්පතු | 1,848,157 | 1,816,227 | 31,930 |
| මහජන බැංකු ස්ථාවර තැන්පතු | 3,781,056 | 3,761,131 | 19,925 |

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සඳහා සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) කලින් ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (Prepaid staff benefits) | 1,099,254 | වර්ෂයේ ආරම්භක හා අවසන් ශේෂයන් ගණනය කිරීමට අදාළ වැඩ පත්‍රිකා. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු දේපළ පිරියත හා උපකරණ | 652,000 | ප්‍රසම්පාදන ලිපි ගොනුව. |
| (ඇ) | බාහිර පාර්ශවයන්ට පරිත්‍යාග කරන ලද ඖෂධ | 1,363,702 | බාහිර පාර්ශව වෙත ඖෂධ පරිත්‍යාග කිරීම සඳහා ආයතන ප්‍රධානීන්ගේ විධිමත් අනුමැතින්. |
| (ඇ) | පාරිතෝෂිත ප්‍රතිපාදනය | 9,358,331 | ගණනය කළ ආකාරය දැක්වෙන උපලේඛන. |
| (ඉ) | ණයගැති ශේෂය | 61,365,224 | ශේෂ සනාථ කිරීම. |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 01 දින සිට ලැබිය යුතුව තිබුණු රු.243,031 ක ආදායම හඳුනාගැනීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොකෙරුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් සිදුකරද නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු.118,010,046 ක් වූ මුළු ණයගැති ශේෂය ණයගැතියන් 45 දෙනෙකුගෙන් සමන්විත විය. ඒ තුළ ඇතුළත් ණයගැතියන් 13 කට අදාළ වර්ෂ 05 කට වැඩි ණයගැති ශේෂය රු.2,394,144 ක් වූ අතර එම වටිනාකමින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් සිදුකරද නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.19,997,013 ක් වූ අතර එහි කාල විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එම ශේෂය තුළ ප්‍රමිතියෙන් තොර අමු ඖෂධ සැපයීමට අදාළ රු.2,663,454 ක ණයහිමි ශේෂ 04 ක් ඇතුළත් වී තිබුණු අතර 2016 ජනවාරි 01 දින වන විට පැවති මුළු එකතුව රු.4,914,317 ක් වූ ණයහිමි ශේෂ 35 ක් 2017 සැප්තැම්බර් 21 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 757 | 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික තොග සමීක්ෂණ මගින් හඳුනාගෙන තිබුණු රු.12,893,811 ක තොග අතිරික්තතා හා රු.9,272,132 ක තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ නිලධාරීන් 13 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු එකතුව රු.98,153 ක තත්කාර්ය අතුරු අග්‍රිම 12 කින් මුළු එකතුව රු.27,055 ක අග්‍රිම 04 ක් 2017 සැප්තැම්බර් 20 දින වන විටද පියවා නොතිබුණු අතර, ඉතිරි රු.71,098 ක් වූ අග්‍රිම දින 38 සිට දින 280 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2016 වර්ෂයේ මුළු පිරිවැය රු.362,012,789 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.3 වගන්තිය | ප්‍රසාද දීමනා ගෙවීම සඳහා වාර්ෂික ගිණුම් නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ගිණුම් 2017 අගෝස්තු 11 දින ඉදිරිපත් කර තිබියදී 2016 දෙසැම්බර් 27 දින ප්‍රසාද දීමනා ලෙස රු.1,282,164 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.35,630,966 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,058,076 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.5,427,110 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් බදු වියදම රු.8,244,782 කින් අඩු වුවද, පරිපාලන වියදම් රු.12,307,768 කින් සහ විකුණුම් හා බෙදාහැරීමේ වියදම රු.2,389,401 කින් වැඩිවීම ඉහත පිරිහීමට හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.36,594,692 ක අතිරික්තය 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.30,978,577 ක් හා රු.7,968,427 ක් දක්වා අඩුවී තිබුණි. 2015 වර්ෂයේදී රු.41,058,076 ක් දක්වා නැවත වැඩිවී තිබුණු අතිරික්තය 2016 වර්ෂයේදී රු.35,630,966 ක් දක්වා අඩුවී තිබුණි. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සහ බදු වියදම ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.168,155,576 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂය වන විට රු.235,112,713 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 3.66 කින් හා සියයට 1.61 කින් අඩුවී තිබුණු අතර ජංගම අනුපාතය 1.05 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1. කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 මැයි 11 දිනැති අංක 14853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු පහත පරිදි වේ.

(i) ආයුර්වේද ඖෂධ වර්ග, භෛසජ්‍ය ද්‍රව්‍ය හා සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ විකිණීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.

(ii) සිද්ධ හා යුනානි වැනි අත්‍යාවශ්‍ය ආයුර්වේද ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.

(iii) දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිළට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.

(iv) ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ භෛසජ්‍ය ද්‍රව්‍ය පර්යේෂණ කිරීම හා එබඳු ඖෂධ වර්ග ප්‍රමිත කිරීම.

(v) ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධවල දේශීය ඖෂධ වර්ග නිපදවීම.

(vi) ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යෑම.

(vii) ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් ප්‍රධාන අරමුණු වලින් (vi) සහ (vii) යටතේ දැක්වෙන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු සංශෝධිත වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, සැලසුම්ගත වාර්ෂික දේශීය ඖෂධ නිෂ්පාදනවල වටිනාකම රු.407,357,562 ක් වුවද, තථ්‍ය වාර්ෂික නිෂ්පාදනවල වටිනාකම රු.249,280,913 ක් වූයෙන් අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය රු.158,076,648 කින් හෙවත් සියයට 38.8 ක් ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. යථාර්තයක් බවට පත්කර ගත හැකි සැළසුම් පිළියෙල නොකිරීම, අවශ්‍ය අමු හා වියලි ඖෂධ සපයා ගැනීම සඳහා සුදුසු හා

ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් හඳුනාගෙන නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට කටයුතු නොකිරීම මේ සඳහා බලපා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, සැලසුම් කර තිබුණු නව නිෂ්පාදන වර්ග 12ක අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණයෙන් සියයට 16 ක ප්‍රමාණයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. තවද ක්වාථ හා සිරප් වල අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 45 ක හා සියයට 49 ක ප්‍රමාණයක් පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර අනෙකුත් නිෂ්පාදන අයිතම 07 න් 05 ක තත්‍ය නිෂ්පාදනය සියයට 54 ත් සියයට 80 ත් අතර ප්‍රමාණයකින් යුක්ත විය. ඊට අමතරව නිෂ්පාදනය සඳහා සැලසුම් කර තිබුණු ඖෂධ වර්ග 09 ක් සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ රු.173,747,850 ක් වූ දේශීය ඖෂධ සඳහා පෞද්ගලික අංශයේ වාර්ෂික අවශ්‍යතා ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂයේදී රු.409,167,065 ක් දක්වා සියයට 135 කින් වැඩිකර තිබුණි. නමුත් එම අලෙවි ඇස්තමේන්තුව සපුරාලීමට යොදාගන්නා ක්‍රමවේදය හෝ මෙම වටිනාකම ගණනය කළ ආකාරය හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) 2015 හා 2016 වර්ෂවලදී දේශීය ඖෂධ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල වාර්ෂික අවශ්‍යතා ඇස්තමේන්තුව, තථ්‍ය අලෙවිය හා විචලනයන් පිළිබඳව වූ නිරීක්ෂණ පහතින් දැක්වේ.

(i) ඉකුත් වර්ෂයේදී රාජ්‍ය අංශය තුළ අපේක්ෂිත අලෙවි ආදායමෙන් ළඟාකරගත නොහැකිවී තිබුණු ආදායම රු.93,305,178 ක් එනම් සියයට 18 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ළඟාකර ගත නොහැකිවී තිබුණු ආදායම රු.154,667,424 ක් එනම් සියයට 26 ක් දක්වා වර්ධනයවී තිබුණි. එසේම ඉකුත් වර්ෂයේ පෞද්ගලික අංශයේ අපේක්ෂිත ආදායමෙන් ළඟාකර ගත නොහැකිවී තිබුණු ආදායම රු.22,727,709 ක් එනම් සියයට 36 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ළඟාකර ගත නොහැකිවී තිබුණු එම ආදායම රු.280,633,384 ක් එනම් සියයට 69 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයේදී රාජ්‍ය අංශය තුළ අපේක්ෂිත අලෙවි ආදායමෙන් ළඟාකරගත් අලෙවි ආදායමේ ප්‍රතිශතය 82 ක් වුවද, 2016 ජනවාරි 01 දින සංස්ථා නිෂ්පාදනයන්ගේ මිල වැඩිකර තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී ළඟාකරගත් අලෙවි ආදායමේ ප්‍රතිශතය 74 දක්වා අඩුවී තිබුණි.

(iii) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් 2016 ජනවාරි මාසයේදී සංස්ථා නිෂ්පාදනයන්ගේ මිල ගණන් සියයට 37 සිට සියයට 228 ක පරාසයකින් වැඩිකර තිබුණි. එහෙත් රාජ්‍ය අංශයේ තත්‍ය අලෙවි ආදායම ඉකුත් වර්ෂයේ තත්‍ය අලෙවි ආදායම සමඟ සැසඳීමේදී රු.28,554,533 ක් හෙවත් සියයට 7 ක් වැනි සුළු ප්‍රතිශතයකින් පමණක් වැඩිවී තිබුණද අලෙවි ඒකක ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඒකක 6,934 කින් හෙවත් සියයට 1 කින් අඩුවී තිබුණි.

(iv) නව ඖෂධ නිෂ්පාදන 10 ක් විවෘත වෙළෙඳපොලට හඳුන්වාදී ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස රු.7,521,992 ක් වැයකර ඉසිවර ඔසු දොරට වැඩීම නමින්වූ උළෙලක් ඉකුත් වර්ෂය තුළදී පවත්වා තිබුණි. එම වියදමෙන් සියයට 71 ක් හෙවත් රු.5,399,970 ක් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැයකර තිබුණු නමුත් නව නිෂ්පාදන එකක් පමණක් හඳුන්වාදී තිබුණු අතර පැරණි නිෂ්පාදන 09 ක ඇසුරුම් නවීකරණය කර ඉදිරිපත් කර තිබුණි. නව නිෂ්පාදන හරහා සංස්ථාවේ අලෙවි ආදායම සියයට 50 ක ප්‍රතිශතයකින් වර්ධනය කර ගැනීමට මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කර තිබුණද 2016 වර්ෂයේදී මිල ගණන් වැඩිකර තිබියදීත් 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ සියයට 9 ක ප්‍රතිශතයකින් පමණක් සංස්ථාවේ සමස්ත ආදායම වර්ධනය වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සමඟ ඔසු වගා දිරිගැන්වීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂය තුළදී ලක්ෂ 08 ක ජනතාවක් දැනුවත් කිරීමට, වෙළඳපොල සමීක්ෂණයක් පැවැත්වීමට හා සමාලෝචිත වර්ෂයේ අලෙවි ආදායම හා ලාභය පිළිවෙලින් රු.41,190,000 කින් හා රු.10,290,000 කින් ඉහළ නැංවීමට දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි මාසයකට අවම වශයෙන් දිස්ත්‍රික්ක 02 ක වැඩමුළු පැවැත්වීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වී තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් රු.10,000,000 ක ණය මුදලක් 2016 ජුනි 09 දින ලබා ගෙන තිබුණි. කෙසේ වුවත් 2016 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික්ක 02 ක වැඩමුළු 05 ක් පමණක් පවත්වා තිබුණු අතර වෙළඳපල

සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. එසේම අපේක්ෂිත අලෙවි ආදායම හා ලාභ වැඩිකර ගෙනද නොතිබුණි.

(ආ) රජයේ බැංකු දෙකක පවත්වා ගෙන යන ජංගම ගිණුම් තුනක සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය මුදල් ශේෂ පිළිවෙලින් රු.28,996,320 ක් රු.26,985,826 ක් හා රු.114,097,332 ක් විය. එසේම 2016 දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය 8.323 ක් වූ බැවින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හැර ඉතිරි මුදල් පොලී ආදායම් ලැබෙන කෙටිකාලීන ආයෝජන වල තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1973 ඖෂධාගාර නියෝග අංක 21 ප්‍රකාරව මහජනයාට විකිණීමට තිබෙන යම් ඖෂධයක් සකස් කිරීමේ සෑම සූත්‍රයක්ම එම කාර්යය සඳහා පත් කරන ලද සූත්‍ර කමිටුව මගින් පළමුව අනුමත කරගත යුතු වුවත්, සංස්ථාව විසින් නව නිෂ්පාදන ලෙස 2015 හා 2016 වර්ෂවල වෙළඳපොලට හඳුන්වාදී තිබුණු ඖෂධ වර්ග 10 ක් සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටු අනුමැතිය 2017 සැප්තැම්බර් 01 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී වැඩ තහනම් කරන ලද සේවකයින් 06 දෙනෙකුගෙන් සංස්ථාවට අයවිය යුතු එකතුව රු.913,720 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ජංගම අලෙවියට අදාළ උපරිම ණය සීමාව රු.5,000 ක් හා උපරිම ණයගැති කාල සීමාව දින 21 ත් දින 30 ත් අතර විය යුතු බව 2015 ජුනි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. නමුත් එම තීරණයට පටහැනිව කටයුතු කර තිබීම හේතුවෙන් 2017 අගෝස්තු 15 දින වන විටත් පියවා ගත නොහැකිව තිබුණු මුළු ණය ශේෂය රු.3,716,652 ක් විය.

(ඊ) රජයේ බැංකු දෙකක පවත්වා ගෙන යන ජංගම ගිණුම් දෙකකට අදාළ 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව, වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවූ තැන්පතු රු.337,010 ක් හා රු.224,168 ක් විය. ඉන් රු.22,450 ක් තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ලෙසද, රු.16,633ක් 1988 වර්ෂයේ සිට 1992 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ බැංකු ගත නොකළ මුදල් ලෙසද දක්වා තිබුණි. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන අලෙවි මධ්‍යස්ථාන 15 ක ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී උපයා තිබුණු අතිරික්තය ලෙස පිළිවෙලින් රු.69,037,667 ක් හා රු.59,084,469 ක් ගණනය කර තිබුණු නමුත් එම ගණනය කිරීම සඳහා විකුණුම් පිරිවැය ඇතුළත් කර නොතිබුණි.

(ආ) නිසි සැලසුම් කිරීමකින් තොරව අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කිරීම හේතුවෙන් කෙටි කාලයක් තුළදී අලෙවි මධ්‍යස්ථාන 04 ක් වසා දැමීමට සිදුවී තිබුණි.

(ඇ) නිසි සැලසුමකින් තොරව නව අලෙවි මධ්‍යස්ථාන 04 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භකර තිබුණි. ඒ හේතුවෙන් අදාළ ගිවිසුම්වලට එළැඹි දිනයන්වල සිට සති 03 ත් මාස 09 ත් අතර කාල පමාවකින් පසු අලෙවි කටයුතු ආරම්භ කර තිබුණු අතර අලෙවි කටයුතු ආරම්භ කිරීමට පෙර කාලය වෙනුවෙන් රු.739,750 ක කුලී මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී නිකවැරටිය ඔසු උයනේ ආදායම රු.866,065 ක් වූ අතර එහි වියදම රු.4,973,307 ක් වූයෙන් ලද මුළු අලාභය රු. 4,107,242 ක් විය. සමාලෝචිත වර්ෂයේ නිකවැරටිය ඔසු උයනේ සමස්ථ වියදමෙන් සියයට 98 ක් සාමාන්‍ය පරිපාලන වියදම් වූ අතර සියයට 2 ක් වැනි සුළු ප්‍රමාණයක් ඔසු උයනේ සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණි. ඔසු උයනෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුදුසු පියවර හඳුනාගෙන ක්‍රියාත්මක නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළකැද මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී සැපයුම්කරුවන් දෙදෙනෙකු වෙත රු.2,458,463 ක් ගෙවීම් කර තිබුණද සැපයුම්කරුවන් තෝරාගත් ආකාරය විගණනයට ඉදිරිපත් නොවුනු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ඔවුන් දෙදෙනා සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 613,520 ක් වූ බොරලැල්ල ආයුර්වේද රෝහල් පරිශ්‍රය තුළ සංස්ථා අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකුගෙන් මිල විමසීම් කර තිබුණු නමුත් ඉන් තිදෙනෙකු වෙත මිල විමසීම් ලිපි අතින් භාරදී තිබුණු අතර ඉතිරි දෙදෙනා වෙත මිල කැඳවීම් ලිපි තැපෑලෙන් යවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සීමිත ලංසු කැඳවීමකදී දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවද දින 07 ක කාලයක් පමණක් ලබාදී තිබුණු බැවින් තැපැල් මගින් මිල විමසුම් ලිපි යවා තිබුණු කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාට මිල ගණන් එවීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම ඔවුන් දෙදෙනා මිල ගණන් ඉදිරිපත් කරද නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයේ තරඟකාරිත්වය හා විනිවිදභාවය ගිලිහී ගොස් තිබුණි.

(ii) මිල විමසුම් ලිපි අතින් භාරදී තිබුණු කොන්ත්‍රාත්කරුවන් තිදෙනා පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු නමුත් මිල ගණන් දක්වා තිබුණු ප්‍රමාණ පත්‍රයෙහි තිබුණු අත්සන් හා මුද්‍රාවල ස්වභාවය සැක සහිත විය. අවම මිල වූ රු.855,932 ක් ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත 2016 මැයි 17 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, දෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු ඉදිරිපත් කර තිබුණු දුරකථනවලට ඇමතීමේදී ඔවුන් අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ සේවකයින් බවත්, තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගේ දුරකථනවලට ඇමතීමේදී එම ආයතනය ඉදිකිරීම් කටයුතු සිදු නොකරන ආයතනයක් බවත් තහවුරු විය.

(iii) අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ නම හා ICTAD ලියාපදිංචි අංකය පමණක් ඉදිරිපත් කර තිබුණු අතර දෙවන හා තෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට අවශ්‍ය එම විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(iv) මෙම ප්‍රසම්පාදනය පිළිබඳව කටයුතු කරන ලද නිලධාරීන් අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගේ සහයෝගයෙන් ව්‍යාජ ලිපිලේඛන පිළියෙල කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 වගන්තියට අනුකූල නොවන ලෙස හා ලංසු, ලංසුකරුවන්ගේ සුදුසුකම්, ලංසුවල නීත්‍යානුකූල

වලංගුභාවය පරීක්ෂා නොකර තරඟකාරීත්වයකින් හා විනිවිදභාවයකින් තොරව කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) යාපනය අලෙවි මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් බදු පදනමට ලබාගැනීමට අදාළව නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සහ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.6 ඡේදයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් ගොඩනැගිල්ලේ තක්සේරුව ලබා නොගෙන යාපනය අලෙවි මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා මාසයකට රු.65,000 ක බදු කුලියක් ගෙවීමේ පදනමින් වර්ග අඩි 1,309 ක ගොඩනැගිල්ලක් වර්ෂ 05 ක කාලයක් සඳහා රු. 4,219,800 කට සමාලෝචිත වර්ෂයේදී බද්දට ගෙන තිබුණි.

(ii) බදු පදනමින් ලබාගෙන තිබුණු යාපනය අලෙවි මධ්‍යස්ථානයට අදාළ බදු ගිවිසුමේ 7 වන ඡේදයේ සඳහන් පරිදි නවීකරණ කටයුතු සඳහා බදු හිමියාගේ අනුමැතිය ලබා නොගෙන වැට් බදු සහිතව රු.1,365,048 ක් වැය කරමින් එම මධ්‍යස්ථානය නවීකරණය කර තිබුණි. නැවත ගලවාගෙන යා හැකි වෙන් කිරීම් සඳහා දරන ලද වියදම් හැරුණු කොට ස්ථිර පදනමින් වැය කර තිබුණු රු.257,375 ක් බදු හිමියාගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2017 සැප්තැම්බර් 01 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු.1,065,900 ක් වූ බදු පදනම මත ලබාගෙන තිබුණු යාපනය අලෙවි මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලංසු කැඳවා තිබුණි. ඉන් 03 දෙනෙකු පමණක් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වූ නමුත් ඉතිරි 02 දෙනාගේ තොරතුරු සොයා ගත් ආකාරය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 03 දෙනා අතරින් 02 දෙනෙකු වෙත පමණක් ලංසු කැඳවීමේ ලිපි තැපෑලෙන් යවා තිබුණු නමුත් ඉතිරි 03 දෙනා වෙත එම ලිපි අතින් භාරදී තිබුණි. දෙදෙනෙකු වෙත පමණක් එම ලිපි තැපෑලෙන් යවා ඉතිරි තිදෙනා වෙත අතේ භාරදීමට හේතුවූ කරුණු ඉදිරිපත් නොකෙරුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, සීමිත ලංසු කැඳවීමකදී දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවද දින 04 ක කාලයක් පමණක් ලබාදී තිබුණු බැවින් තැපැල් මගින් ලංසු කැඳවීමේ ලිපි යවා තිබුණු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාට ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු අතර ඔවුන් දෙදෙනා ලංසු ඉදිරිපත් කරද නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයේ තරඟකාරීත්වය හා විනිවිදභාවය ගිලිහී ගොස් තිබුණි.

(iv) මිල විමසුම් ලිපි අතින් භාරදී තිබුණු කොන්ත්‍රාත්කරුවන් තිදෙනා පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඔවුන් අතරින් රු.1,365,048 ක අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලියාපදිංචි කොන්ත්‍රාත්කරු වෙත 2016 ජුනි 23 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(v) කෙසේ වෙතත් දෙවන හා තෙවන අවම ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් දෙදෙනා විසින් ඉදිරිපත් කර තිබුණු ලංසුව ඇතුළත් ප්‍රමාණ පත්‍රය, ඔවුන්ගේ ව්‍යාපාර නාමය, ලිපිනය හා දුරකථන අංකය ඇතුළත් ලිපි ශීර්ෂයක් සහිත ආවරණ ලිපියක් සමඟ ඉදිරිපත් කර නොතිබුණු අතර ICTAD ලියාපදිංචි අංකයද ඉදිරිපත් කර නොතිබුණි.

(vi) ප්‍රමාණ පත්‍රයෙහි තිබුණු අත්සන් හා මුද්‍රාවල ස්වභාවයද සැක සහිත වූ අතර එම ලංසුකරුවන් දෙදෙනාගේ අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය.

(vii) ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 වගන්තියට අනුකූල නොවන ලෙස කටයුතු කරමින් ලංසුකරුවන්ගේ සුදුසුකම් හා ලංසුවල නිත්‍යානුකූල වලංගුභාවය පරීක්ෂා නොකර තරඟකාරීත්වයකින් හා විනිවිදභාවයකින් තොරව කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය

**(ඉ)** පිරිවැය රු.1,425,000 ක් වූ ලීටර් 300 ක ධාරිතාවෙන් යුත් ෂැම්පු මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) මෙම මිලදී ගැනීම සඳහා යෙලෝ පේජස් මගින් තෝරා ගත් සැපයුම්කරුවන් 04 දෙනෙකු වෙතින් 2015 නොවැම්බර් 17 දින ලංසු කැඳවා තිබුණු බවට සටහන් යොදා තිබුණු නමුත් ලංසු කැඳවීමේ ලිපි භාරදුන් ආකාරය පිළිබඳව ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ii) සැපයුම්කරුවන් 04 දෙනාගෙන් 03 දෙනෙකු විසින් ලංසු කැඳවීම් ලිපි යැවූ දිනට පෙර දිනයක් වූ 2015 නොවැම්බර් 11 දින ලංසු අතින් භාරදී තිබුණි. එසේම දෙවන හා තුන්වන අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු ලිපිනයන්, දුරකථන අංකය හා ෆැක්ස් අංකය ව්‍යාජ ඒවා බව තහවුරු විය.

(iii) මෙම යන්ත්‍රය සඳහා තිබිය යුතු පිරිවිතර 15 ක් පිළියෙල කර තිබුණු නමුත්, ලංසුකරුවන් ඉදිරිපත් කර තිබුණු පිරිවිතර ඒ හා සසඳා නොබලමින් අවශ්‍යතා පිරිවිතර 15 න් පිරිවිතර 08 ක් පමණක් සම්පූර්ණ කර තිබුණු රු.1,425,000 ක් වූ අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු වෙතින් යන්ත්‍රය මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශකර තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 වගන්තියට අනුකූල නොවන ලෙස කටයුතු කරමින් ලංසුකරුවන්ගේ සුදුසුකම් හා ලංසුවල නිත්‍යානුකූල වලංගුභාවය පරීක්ෂා නොකර තරඟකාරීත්වයකින් හා විනිවිදභාවයකින් තොරව කටයුතු කරමින් සැපයුම්කරු තෝරා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඊ)** සංස්ථාවට සුදු යකඩ Cubicals 02 ක් සපයා සවි කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු සුරක්ෂණයක් ලබා නොගෙන තෝරා ගත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත සංස්ථාවට සුදු යකඩ Cubicals 02 ක් සපයා සවි කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු බැවින්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මිල වූ රු.2,461,312 ක් වෙනුවට රු.3,322,771 ක් දක්වා

මිල වැඩි කර දෙන මෙන් කොන්දේසියක් ඉදිරිපත් කර තිබුණු නිසා නැවත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට සිදුවී තිබුණි.

(ii) මිල ගණන් කැඳවීමේදී ලංසුව ඉදිරිපත් කිරීමේ කාලය අවසන් වූ පසු ඉදිරිපත් කල ලංසු ප්‍රතික්ෂේප කළයුතු වුවද, දෙවන වර මිල ගණන් කැඳවීමේදී ලංසුව ඉදිරිපත් කිරීමේ කාලය අවසන් වූ පසු රු.2,186,382 ක අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණයක් ලබා නොගෙන තෝරා ගත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත නිෂ්පාදනාගාරයේ බොයිලේරුව සඳහා අළුතින් සුදු යකඩ ටැංකියක් සපයා සවිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තෝරාගත් අවම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු මිල වූ රු.1,910,000 ක් වෙනුවට රු.2,700,000 ක් දක්වා මිල වැඩිකර දෙන මෙන් කොන්දේසියක් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් නැවත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට සිදුවී තිබුණි. ඒ අනුව නැවත රු. 2,366,367 කට වෙනත් කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබීම නිසා සංස්ථාවට රු. 456,367 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඌ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම ප්‍රකාරව, අමු ද්‍රව්‍ය ලබාගැනීම කාර්යක්ෂම කිරීම සඳහා අමු හා වියලි ඖෂධ සුලභ හා දුලබ කාල වකවානු හඳුනාගෙන වාර්ෂික අවශ්‍යතාව සපයා ගැනීමට සැලසුම් කළ යුතු විය. 2015 දෙසැම්බර් 21 දින සිට 2016 ජනවාරි 26 දින දක්වා කාලය තුළදී හෙක්ටර් කොබ්බැකඩුව කෘෂි පර්යේෂණ හා පුහුණු ආයතනයේ තොග මිල ගණන් අනුව පිටකොටුව මැනින් වෙළඳ සංකීර්ණයේ දෙහි කිලෝග්‍රෑම් 1 ක තොග මිල රු.70 ත් රු.100 ත් අතර ඉතා අඩු මිල පරාසයක පැවති නමුත්, 2016 පෙබරවාරි 05 දින කිලෝග්‍රෑම් 1 ක් රු.327 බැගින් දෙහි කිලෝග්‍රෑම් 700 ක් රු.228,900 ක් වැයකර මිලදී ගෙන තිබුණි.

(එ) පිරිවැය ඇස්තමේන්තුව රු.71,099,983 ක් වූ සිව්මහල් ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) මෙම කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අංක අමප/08/1896/339/015/ටීබීආර් හා 2008 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.71,099,983 ක බදු රහිත කොන්ත්‍රාත් වටිනාකමක්

සහිතව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුණු අතර 2011 ඔක්තෝබර් මස 24 දින එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව වැඩ ආරම්භ කළ දින සිට දින 540 ක් ගත වන 2013 දෙසැම්බර් 25 දින වන විට වැඩ නිම කළ යුතු විය. 2017 සැප්තැම්බර් 01 දින වන විටද මෙම ඉදිකිරීම නිමකර නොතිබුණු අතර නිසි අනුමැතියකින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර නොතිබියදී ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය නොකර 2014 වර්ෂයේදී රු.25,469,960 ක් හා 2015 වර්ෂයේදී රු.6,514,966 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයකට යටත්ව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2012 ජූලි 13 දින රු.15,926,396 ක් ගෙවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුවේ ප්‍රමාද කාලය නොසලකා 2016 ජූනි 01 දින ඉංජිනේරු සංස්ථාව සමඟ නව අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර ඉතිරිව තිබුණු වැඩ පිළිබඳ ඇගයීමක් සිදු නොකර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලට අමතරව 2016 ජූනි 20 හා 2016 සැප්තැම්බර් 30 යන දෙදින එකතුව රු.12,992,042 ක අත්තිකාරම් මුදලක් නැවතත් ගෙවා තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ ආරම්භක සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2005 වර්ෂයේදී රු.882,572 ක් පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු නමුත් එම සැලැස්මට ගිනි නිවීමේ පද්ධතියක්, සේවක සේවිකාවන් සඳහා වෙන වෙනම වැසිකිලි, lighten lingarrester සහ PA BX System & wiring පද්ධතියක් ඇතුළත් කර නොතිබුණු බැවින් මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.71,099,983 සිට රු.139,951,018 දක්වා විෂය පථය වෙනස් කිරීමට සිදුවී තිබුණි.

(iv) 2014 දෙසැම්බර් මස අමාත්‍ය මණ්ඩල තීරණ හා නිර්දේශ අනුව, වැඩි අත්තිවාරම් සහිත ඉදිකිරීමකදී යෝජිත භූමියෙහි පාංශු පරීක්ෂාව මෙන්ම අනාගත අවශ්‍යතාද නිවැරදිව හඳුනාගත් අවශ්‍යතා තක්සේරුවක් මත විෂය පථය නිශ්චය කිරීම පූර්ව ප්‍රසම්පාදන අවශ්‍යතාවයක් වුවද ඒ පිළිබඳ නිසි අවධානයක් යොමු කර නොතිබුණු බැවින් මෙසේ වරින්වර විෂයපථය වෙනස් කිරීමට හා ව්‍යාපෘති පිරිවැය සංශෝධනය කිරීමට සිදුවී තිබුණි.

## 4.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

-----------------------------------

මාතර අලෙවි මධ්‍යස්ථානය විවෘත කිරීමේ ආරම්භක උත්සවය සඳහා සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව පිළියෙල කර තිබුණු වියදම් ඇස්තමේන්තුව පදනම් කරගනිමින් රු.100,000 ක අත්තිකාරමක් සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත ලබාදී තිබුණි. එම උත්සවය වෙනුවෙන් රු.83,760 ක් වැයකර තිබුණු අතර රු.8,260 ක් සඳහා බිල්පත් ඉදිරිපත් කිරීමකින් තොරව අත්තිකාරම් පියවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ ආරක්ෂක නියාමක තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2015 සහ 2016 වර්ෂවලදී පුද්ගලයින් 07 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන එම වර්ෂ දෙක තුළදී පිළිවෙලින් රු.986,635 ක් හා රු.1,988,630 ක් වශයෙන් මුළු එකතුව රු.2,975,265 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. මෙම පුද්ගලයින් 07 දෙනා සතු අධ්‍යාපන සුදුසුකම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සංස්ථාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී තනතුරක් නොතිබියදී හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික භාණ්ඩාගාර නියෝජිතවරයාගේ සහ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ නියෝජිතවරියගේ අනුමැතියකින් තොරව, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති අංශය යටතේ සංස්ථා නිෂ්පාදන කලාපිය වශයෙන් ප්‍රචාරණය හා ප්‍රවර්ධනය කරලීම සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරීන් 06 දෙනෙකු පත් කිරීමට හා මසකට රු.20,000 බැගින් දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව පත්කර තිබූ නිලධාරීන් 05 දෙනෙකු සඳහා 2015 නොවැම්බර් සිට 2016 ජුනි දක්වා රු.497,331 ක් දීමනා ලෙස ගෙවා තිබූ අතර එම වියදම ආයතන හා පරිපාලන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුළ සේවක සංඛ්‍යාව ඉක්මවා නිෂ්පාදන සහායකවරු 10 දෙනෙකු, කළමනාකාර සහකාරවරු 09 දෙනෙකු, රියදුරන් 03 දෙනෙකු, වාහන සහායකවරයෙකු, කාර්යාල කාර්ය සහායකවරයෙකු හා විගණන නිලධාරීවරයෙකු වශයෙන් සේවකයින් 25 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ

අනුමැතියකින් තොරව 2015 වර්ෂය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. එකී කාර්යය මණ්ඩලයට 2015 හා 2016 යන වර්ෂ දෙක තුළදී පිළිවෙලින් රු.4,377,379 ක් හා රු.13,723,099 ක් වශයෙන් එකතුව රු.18,100,678 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. ඉන් 09 දෙනෙකු අදාළ තනතුර සඳහා වූ අවම සුදුසුකම්ද සපුරා නොතිබුණි.

(ඈ) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ගේ ඉල්ලීම පරිදි කම්කරු තනතුර සඳහා 2016 පෙබරවාරි 01 දින සිට සේවකයෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.102,530 ක දීමනා ගෙවා තිබුණි. මෙම සේවකයාගේ පැමිණීම හෝ පිටවීම පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) එම්ඒ 1-1 සේවා ගණයේ වැටුප් ලබමින් ස්ථානභාර නිලධාරී තනතුරු දැරූ නිලධාරීන් 03 දෙනෙකු, අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ සහකාර කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) තනතුරු සඳහා 2015 ජුනි මාසය තුළදී උසස් කර ජේඑම්1-1 සේවා ගණයේ වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. 2015 ජුනි මාසයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා මෙම නිලධාරීන් 03 දෙනා වෙත වැටුප් ලෙස රු.359,309 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව, උපාධිය ලැබීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක වර්ෂ 12ක සේවා පළපුරුද්දක් පැවතිය යුතු වුවද වෙළඳ ආයතනයක වර්ෂ 07ක සේවා පළපුරුද්ද සහිත අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වන ලෙසට පුවත්පත් දැන්වීම් පලකර 2016 අප්‍රේල් 01 දින සිට 2017 මාර්තු 31 දින දක්වා වර්ෂ 01ක කාලයක් සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරිනියක බඳවා ගෙන තිබුණු අතර ඇයගේ සේවා කාලය 2018 මාර්තු 31 දින දක්වා දීර්ඝකර තිබුණි. විගණිත දිනය වූ 2017 සැප්තැම්බර් 18 දින දක්වා බඳවා ගැනීම් පරිපාටියේ සුදුසුකම් වෙනස් කිරීමට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(උ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු නාම 26 ක වැඩ බැලීම සඳහා සුදුසුකම් නොතිබුණු පුද්ගලයන් 26 දෙනෙකු පත්කර තිබුණි. 2015 හා 2016 වර්ෂ දෙක තුළදී එම පුද්ගලයන් වෙනුවෙන් පිළිවෙලින් රු.345,433 ක් හා රු.937,361 ක් වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි.

(ඖ) සංස්ථාවට අත්‍යාවශ්‍ය තනතුරු වූ තාක්ෂණික සහකාර (විදුලි) සහ විදුලි කාර්මික තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඓ) 2016 මාර්තු 02 දින සිට වර්ෂයක කාලයක් සඳහා ද්විතීයන පදනමට පත්කර තිබුණු සාමාන්‍යාධිකාරීවරයාගේ සේවය 2016 අප්‍රේල් 19 දින අවසන් කර තිබුණි. එදින සිට 2016 නොවැම්බර් 22 දින දක්වා පුරප්පාඩු වී තිබුණු එම තනතුර සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියට යටත්ව විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පත්කිරීමට 2016 නොවැම්බර් 23 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම පත්වීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගත් බව හෝ සාමාන්‍යාධිකාරී තනතුරට අදාළ සුදුසුකම් සහිත නිලධාරියෙකුද යන බව හෝ තහවුරු නොකෙරුණි.

## 4.7 අධිකාරී බලය නොලත් ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක්, තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට සංස්ථාවලට හැකියාව තිබේ. 1997 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දිරි දීමනා ක්‍රමවේදය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බවට 2007 නොවැම්බර් 09 දින පවත්වා තිබුණු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කර තිබුණු නමුත් 2017 සැප්තැම්බර් 30 දින වන විටත් එම අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම දිරි දීමනා ක්‍රමය තුළ නිෂ්පාදන පිරිවැය මත පදනම්ව නිෂ්පාදන දිරිදීමනා, පැමිණීමේ දීමනා, ඉතිරි වෛද්‍ය නිවාඩු දීමනා හා ඵලදායිතා දිරිදීමනා වශයෙන් වර්ග 04 ක දිරි දීමනා ඇතුළත් වන අතර වෙළඳපල උද්ධමනකාරී තත්ත්වයක් තුළ නිෂ්පාදන පිරිවැය වාර්ෂිකව වැඩිවන බැවින් එම දිරිදීමනාවද වාර්ෂිකව වැඩිවේ. ඒ හේතුවෙන් දිරි දීමනා ක්‍රමයකින් අපේක්ෂිත සේවක කාර්යක්ෂමතාවය වැඩිවීමක් සිදු නොවන බවද නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ පහකදී මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණු මුළු දිරි දීමනාවල එකතු අගය රු.252,076,299 ක් විය.

(ආ) 1987 නොවැම්බර් 19 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ආවේනික වූ පරිපාලනමය හා පාලන රෙගුලාසි ඇතුළත් කරමින් නිවාඩු කාර්යය පරිපාටියක් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණු නමුත් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු බැවින් එම නිවාඩු කාර්යය පරිපාටිය වෙනුවට 2009 ජනවාරි සිට ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ භාවිතා කළ යුතු බව 2009 පෙබරවාරි 16 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. නමුත් එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට පටහැනිව යමින් වාසි දායකවන පරිදි විටක විධිමත් අනුමැතියක් නොමැති නිවාඩු කාර්යය පරිපාටියත් විටක ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛත් අනුගමනය කරන බව නිරීක්ෂණය විය. ඉහත සඳහන් නිවාඩු කාර්යය පරිපාටියේ 8.2 වගන්තිය අනුව, පත්වීම් ලද පළමු වර්ෂයේදී වෛද්‍ය නිවාඩු සඳහා හිමිකම් නොතිබුණු නමුත් පළමු වර්ෂයේදී ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.226,643 ක දීමනා නිලධාරීන් හා සේවකයන් 32 දෙනෙකු වෙත ගෙවා තිබුණි.

(ඇ) ලෝකයේ රටවල් 11 ක වෘත්තීය සමිති සාමාජිකයින් 18 දෙනෙකුගේ සහභාගීත්වයෙන් කොරියාවේ සෝල් හි 2016 මැයි 23 දින සිට 2016 මැයි 27 දින දක්වා දින 05 ක කාලය තුළදී පවත්වා තිබුණු trade union organizing strategies for development and inclusion වැඩමුළුවට සංස්ථාවේ වෘත්තීය සමිති සාමාජිකාවක් සහභාගීවී තිබුණි. නිලධාරිනිය වෙත එම දින 05 පුරාවට නවාතැන් සහ ආහාර අදාළ රටෙන් ලබාදී තිබියදී, 2015 මැයි 15 දිනැති අංක මු.අ. 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වෘත්තීය සමිති සාමාජිකාව වෙත අනියම් දීමනා හා සංයුක්ත දීමනා වශයෙන් ඇමරිකානු ඩොලර් 2,300 කට සමාන රු.343,692 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක හා දින 11 ක ප්‍රමාදයක් සහිතව 2017අගෝස්තු 11 දින ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 5 ක් වෙනුවෙන් පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහතින් දැක්වේ.

(අ) රසායනාගාර වාර්තාව සහ වෛද්‍ය කමිටු වාර්තාව මගින් ප්‍රතික්ෂේපවී තිබියදී රු.1,980,000 ක් වටිනා මී පැණි කිලෝ ග්‍රෑම් 4,000 ක් 2012 ජුනි මාසයේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර මෙම මිලදී ගැනීමට අදාළ වවුචර්, ලදුපත් හා අදාළ ලිපි ගොණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. 2015 වර්ෂය වන විට එම මී පැණි පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

(ආ) සංස්ථාව තුළ රු.5,930,284ක වියදමින් නිෂ්පාදනය කළ හැකිව තිබුණු අභ්‍රක භෂ්ම හා නාග භෂ්ම කිලෝ ග්‍රෑම් 200 ක් රු.7,137,130 ක් වැය කර ආනයනය කිරීම නිසා රු.1,206,846ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) නවදිල්ලි නුවර ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලය තුළ දේශීය වෛද්‍ය කටයුතු සඳහා කාර්යාලයක් ලබා ගෙන අළුත්වැඩියාව හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා 2012 ඔක්තෝබර් 15 දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත රු.3,000,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණි. අත්තිකාරම් ලබාදී වර්ෂ 2ක් ගතවී ඇතත්, අදාළ අරමුණ ඉටුකර ගත නොහැකිවී තිබුණි.

(ඈ) සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩමක 2009 වර්ෂයේදී රු.1,808,795 ක් වැය කර ආරක්ෂිත වැටක් ඉදිකර තිබුණු අතර නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට යෝජිත මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | තොග පාලනය | උපරිම, අවම හා යලි ඇණවුම් තොග මට්ටම් නිරණය කර තිබුණද ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර නොතිබීම, තොග ක්‍රමානුකූලව ගබඩා නොකිරීමෙන් මුලින් ලැබීම් මුලින් නිකුත් කිරීම් ක්‍රමය මත තොග නිකුත් කිරීම් සිදුකර නොතිබීම. |
| (ආ) | වර්ෂය අවසන් තොග අගය කිරීම | වර්ෂය අවසන් තොග වටිනාකම පොත් ශේෂය පදනම් කරගෙන ගණනය කිරීමෙන් පසු භෞතික ශේෂයේ වටිනාකම සමහ සසඳා තොග අතිරික්තතා හා ඌනතා මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබීම. |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

## ගිණුම් පිලියෙළ කිරීමේ පදනම සහ ගිණුම් ප්‍රතිපත්ති - 2016

**1. අනුකූලතා ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් පළ කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 අගෝස්තු 03 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

**2. මිනුම් පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිලියෙළ කර ඇත.

(අ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හිනිර්දේශ කර ඇති ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය පදනම් කරගෙන ඒවායේ වර්තමානය අගයයටතේ පෙන්වා ඇත.

(ආ) ව්‍යුත්පන්න නොවන මූල්‍ය සාධන පත්‍ර ඒවායේ සාධාරණ වටිනාකම යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධකය සඳහා කිසිදු ගැලපුමක් කර නොමැත.

**3. අඛණ්ඩ පැවැත්ම**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙහි නුදුරු අනාගතයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව අධ්‍යක්ෂ මණ්ඩළය විසින් තක්සේරු කර ඇති අතර සංස්ථාව ඇවර කිරීමක් හෝ වෙළඳාම නතර කිරීමක් අපේක්ෂා නොකරයි.

**4. සංසන්දනාත්මක තොරතුරු**

මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමට හැකි වන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වෙනස් කර යලි වර්ගීකරණය කර ඇත.

## 5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන්ට බලපාන විවිධ විනිශ්චය, උපකල්පන සහ ඇස්තමේන්තු, කළමනාකරණය විසින් සිදු කිරීම අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු, පෙර අත්දැකීම්, උපනති සහ පවතින තත්ත්වයන් යටතේ සාධාරණ යයි විශ්වාස කරනු ලබන අනාගත සිදුවීම් පදනම් කරගෙන කරනු ලබයි. ඒ අනුව සත්‍ය ප්‍රතිඵලය, විනිශ්චය සහ ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ අදාළ උපකල්පනවල වලංගුභාවය නිරන්තරයෙන් පුනරීක්ෂණය කරනු ලබයි. යම් කාලපරිච්ඡේදයකට අදාළ ගිණුම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇත්නම් ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට සහ බලපැවැත්වෙන ඉදිරි කාලපරිච්ඡේද වලට අදාළව එම වෙනස්කම හඳුනා ගෙන ඇත. ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ගිණුම් පිළියෙළ කිරීමේදී තීරණාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් ප්‍රමාණයන්ට වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත්තේ පහත දැක්වෙන ගණනයන් කෙරෙහිය.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මිණුම්කරණය

විලම්බිත බදු සම්බන්ධ වත්කම් සහ වගකීම් ගණනය

## 6. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවෙහි මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අයිතම,අස්තිත්වය ක්‍රියාකරන ප්‍රාථමික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදලින් (ක්‍රියාකාරී ව්‍යවහාර මුදල) දක්වා ඇත.

(ආ) ගනුදෙනු සහ ශේෂ

විදේශ මුදල් ගනුදෙනු, ක්‍රියාකාරී ව්‍යවහාර මුදලට පරිවර්තනය කර ඇත්තේ ගනුදෙනු සිදුවන දිනයන්හි පැවති විනිමය අනුපාත උපයෝගී කර ගනිමිනි.

## 7. වත්කම් සහ ඒවායේ තක්සේරු කරන පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල්, බැංකු ශේෂයන් සහ සංස්ථාවේ සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුළ මුදල් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන වත්කම්ය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයක් සංස්ථාව විසින් රඳවා ගැනීමට අපේක්ෂා කරයි.

### 7.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ,පිරියත සහ උපකරණ වටිනාකම ලෙස දක්වා ඇත්තේ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයක් ඇත්නම් එයද අඩු කළ පසු වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම්ප්‍රමිත අංක 01, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම, හි සඳහන් පරිදි දේපළ, පිරියත සහ උපකරණ වල සාධාරණ වටිනාකම සංක්‍රාන්ති වන දිනයේ සලකනු ලබන පිරිවැය ලෙස පෙන්වීමට ඇති වෛකල්පික නිදහස්වීම සංස්ථාව විසින් තෝරා ගන්නා ලදී.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති අයිතමයන්ගේ පිරිවැයට ගැණුම් මිල සහ ඒවා භාවිතා කළ හැකි තත්ත්වයට ගෙන ඒමට වැය කළ ඍජු වියදම් ඇත්නම් ඒවාද ඇතුළත් වේ.

බැහැර කරන ලද දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන්ගේ ලාභය හෝ අලාභය තීරණය කර ඇත්තේ බැහැර කිරීමෙන් ලැබෙන උත්පාදන සහ දේපළ, පිරියත සහ උපකරණ වල ධාරණ අගය අතර වෙනසින් වන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අනෙකුත් ආදායම් හෝ වියදම් යටතේ දක්වා ඇත.

### 7.2 ක්ෂය

ක්ෂය ගණනය කරනු ලබන්නේ ක්ෂය කළ හැකි අගය මතය. එනම් වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය වෙනුවට ආදේශිත වෙනත් අගයකින් එහි අවශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන අගය මතය. මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය හඳුනා ගනු ලබන්නේ සරල මාර්ග ක්‍රමයට දේපළ, පිරියත සහ උපකරණ වල එක් එක් කොටසට අයත් අයිතමයන්ගේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාය.
ප්‍රවර්තන කාලපරිච්ඡේදයට හා සසඳන කාලපරිච්ඡේදයන්ට අදාළ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාල සහ ක්ෂය අනුපාතික පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු) | ක්ෂය අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 | 5% |
| යන්ත්‍රෝපකරණ | අවුරුදු 06මාස 08 | 15% |
| ජල සැපයීමේ උපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| රසායනාගාර උපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 10 | 10% |
| රථ වාහන | අවුරුදු 05 | 20% |
| ආයුධ හා මෙවලම් | අවුරුදු 03 | 33.33% |

වත්කමක ක්ෂය එය ප්‍රයෝජනයට ගන්නා දිනයේ සිට ගණනය කරන අතර එය විකිණීම සඳහා ඉදිරිපත් කිරීමට වර්ගීකරණය කරන දිනය හෝ වත්කම ඉවත් කරන දිනය යන දෙකින් පලමු දිනයේදී ක්ෂය කිරීම නවතනු ලැබේ.

### 7.3 නොනිමි වැඩ

වාර්තා කරන දිනය වන විට නොනිමි වැඩ සඳහා වැය වූ ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර ප්‍රවර්තන වර්ෂය ඇතුළත වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගත් වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යටතේ පෙන්වා ඇත.

## 8. මූල්‍ය වත්කම්

සංස්ථාව මූල්‍ය වත්කම් පහත දැක්වෙන ආකාරයට වර්ගීකරණය කර ඇත. ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ පරිණත වීම තෙක් තබාගන්නා ආයෝජන යනුවෙනි. මූල්‍ය වත්කම අත්පත් කරගන්නා අරමුණ මත වර්ගීකරණය රඳා පවතියි. වාර්තා කරන කාලපරිච්ඡේදයේ සහ වාර්තා කරන දිනට සංස්ථාව සතුව ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් කිසිවක් නොමැත. සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට, ගණුදෙනු පිරිවැය එකතු කර හඳුනාගෙන ඇත.

## 9. තොග

තොගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන දෙකෙන් අඩු අගය පදනම් කරගෙනය. තොගවල පිරිවැය ලෙස දක්වා ඇත්තේ තොග මිලදී ගැනීමේ පිරිවැය, තොග වෙන් කිරීමේ පිරිවැය (පරිවර්තන පිරිවැය) හා පවතින තොග වර්තමාන භාවිතයට දැරූ වියදම්ය.

## 10. වෙළඳ ණයගැතියෝ

සංස්ථාව විසින් වෙළඳ ණයගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇත්තේ සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලැබීමට ගිවිසුම් ගත හිමිකමක් ඇත්නම් පමණකි.

## 11. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කර ඇත්තේ අත ඇති මුදල්, බැංකු ජංගම ගිණුම් ශේෂ සහ ඉහල ද්‍රවශීලීත්වයකින් යුතු කෙටි කාලීන තැන්පතුය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අත ඇති මුදල්, සහ බැංකු තැන්පතුය.

## 12. වගකීම් සහ වෙන්කිරීම්

වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් ඇතුළත ඉල්ලා සිටි අවස්ථාවක ගෙවිය යුතු ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් යටතේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයකදී ගෙවිය යුතු ශේෂ වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හඳුනා ගත් සියලුම වගකීම් ගිණුම් ගත කර ඇත.

වෙන් කිරීමක් හඳුනා ගෙන ඇත්තේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි සම්මුතික හෝ නීතිමය බැඳීමක් තිබෙන අවස්ථාවක එම බැඳීම පියවීමට ආර්ථික ප්‍රතිලාභයක් ගෙවීමට සම්භාවිතාවක් ඇති අවස්ථාවකදීය.

**13. මහා භාණ්ඩාගාරයේ දායකත්වය**

ප්‍රාග්ධන වත්කම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු සියලුම මුදල් සමුච්චිත අරමුදලෙහි දක්වා ඇත.

**14. ණය ගැණුම්**

ණයට ගැණුම් සාධාරණ වටිනාකමින් ගණුදෙනු පිරිවැය අඩුකර මුලින් හඳුනාගෙන ඇත. ණය ගැණුම් වල ධාරණ අගය වන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයයි.

**15. සේවක විශ්‍රාම ප්‍රතිලාභ**

**නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

සංස්ථාව විසින් සුදුසුකම් ලබා ඇති සියලුම සේවකයන් වෙනුවෙන් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 19, සේවක ප්‍රතිලාභ, ප්‍රමිතයෙහි නිර්දේශ කර ඇති පරිදි සංස්ථාව විසින් නිර්වචිත ප්‍රතිලාභ, ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය අනුව වාර්ෂිකව ගණනය කර ඇත.

**16. ආදායම් හඳුනාගැනීම**

මුදල් ලැබෙන දිනය නොසලකා සංස්ථාවටආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාව සහ ආදායම විශ්වාසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණය තෙක් සංස්ථාව විසින් ආදායම් හඳුනා ගනියි.

**17. පුනරාවර්තන වියදම් හඳුනා ගැනීම**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ නිශ්චිත ආදායමක් උපයාගැනීම සහ ඒ සඳහා වැය වන පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙනය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට වැය කළ සියලුම පිරිවැය ප්‍රවර්තන වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී බැර කර ඇත.

**18. ආදායම් බදු**

ආදායම් බදු වියදම යටතේ ප්‍රවර්තන වර්ෂයේ ගෙවිය යුතු බදු සහ විලම්බිත බදු ඇතුළත්ය.

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2016.12.31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | 31.12.2016 | 31.12.2015 |
|---|---|---|
| **වත්කම්** | | රු. |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත හා උපකරණ | **202,162,849.46** | 209,169,793.91 |
| නෙනිම් වැඩ | **125,871,375.83** | 98,024,741.22 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| සේවක ණය | **6,908,954.77** | 7,263,130.10 |
| විලම්භිත බදු | **1,804,601.00** | 3,930,632.00 |
| | **336,747,781.06** | 318,388,297.23 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | **135,103,780.19** | 182,046,968.98 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| සේවක ණය | **10,334,474.13** | 9,447,238.94 |
| රත්‍රං තොගය | **3,912,464.55** | 3,912,464.55 |
| මාජින් ගිණුම | **4,084,156.14** | 4,084,156.14 |
| අනේවාසික විදේශ විනිමය | **893,813.37** | 831,906.16 |
| විවිධ තැන්පත් | **1,043,002.00** | 1,113,002.00 |
| ස්ථාවර තැන්පතු (කෙටිකාලීන) | **79,726,414.95** | 77,226,749.80 |
| වෙළඳ ණයගැතියෝ | **115,516,284.97** | 84,187,324.58 |
| කළින් ගෙවීම් හා අත්තිකාරම් | **3,541,775.17** | 3,899,804.67 |
| බැංකු ශේෂය | **216,816,149.09** | 153,139,964.65 |
| | **570,972,314.56** | 519,889,580.47 |
| **මුළු වත්කම්** | **907,720,095.62** | 838,277,877.70 |
| **ස්කන්ධය හා බැරකම්** | | |
| **ස්කන්ධය** | | |
| දායක ප්‍රාග්ධනය | **5,000,000.00** | 5,000,000.00 |
| | **5,000,000.00** | 5,000,000.00 |
| **බාහිර ස්කන්ධය** | | |
| **මහාභාණ්ඩාගාරය** | **298,098,034.86** | 254,630,369.28 |
| **ලෝක සෞඛ්‍ය සංවිධානය** | **3,994,341.00** | 3,994,341.00 |
| **ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල** | **23,755,000.00** | 15,000,000.00 |
| **ආයුර්වේද පර්යේෂණායතනය** | **761,274.00** | 761,274.00 |
| | **326,608,649.86** | 274,385,984.28 |
| **සංචිත** | | |
| ප්‍රාග්ධන සංචිත | **1,923,741.00** | 1,923,741.00 |
| ප්‍රත්‍යාගණන ලාභය | **3,873,559.55** | 3,873,559.55 |
| විදේශ විනිමය සමකිරීමේ සංචිතය | **19,523.00** | 19,523.00 |
| පෙර වර්ෂයේ ගැලපුම් (පැකේජය අනුව) | **-** | - |
| අනෙකුත් විස්තිරණ ලාභ | **-** | - |
| ලාභලාභ ගිණුමේ ශේෂය | **405,373,376.03** | 382,463,694.37 |
| | **411,190,199.58** | 388,280,517.92 |
| | **742,798,849.44** | 667,666,502.20 |
| **වගකීම්** | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| ප්‍රතිපාදන සඳහා වෙන්කිරීම් | **4,102,225.00** | 3,294,333.00 |
| බැංකු ණය | **52,767,500.21** | 59,105,500.13 |
| පාරිතෝෂික වෙන්කිරීම් | **39,450,855.09** | 36,772,455.24 |
| | **96,320,580.30** | 99,172,288.37 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියෝ | **19,997,013.14** | 17,780,734.53 |
| ඉදිරි වර්ෂයට ලැබීම් | **586,000.00** | 361,000.00 |
| උපචිත වියදම් | **15,621,562.30** | 16,039,308.92 |
| ගෙවිය යුතු තැන්පත් | **6,822,633.11** | 8,615,498.39 |
| ආදායම් බදු ප්‍රතිපාදන | **25,573,457.32** | 28,642,545.29 |
| | **68,600,665.87** | 71,439,087.13 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | **907,720,095.62** | 838,277,877.70 |

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**නිෂ්පාදන ගිණුම**

| | 2016 | 2015 |
|---|---|---|
| | **රු.** | රු. |
| <u>අමුද්‍රව්‍ය පරිභෝජනය</u> | | |
| ආරම්භක තොගය | **52,783,798.66** | 44,883,359.06 |
| එකතු කළා :- ගැණුම් | **126,653,162.00** | 166,283,636.15 |
| ගැණුම් ආනයන | **-** | 3,764,579.11 |
| | **179,436,960.66** | 214,931,574.32 |
| අඩුකළා :- තොග හානි | **-** | - |
| | **179,436,960.66** | 214,931,574.32 |
| අඩුකළා :- අවසාන තොගය | **30,991,179.12** | 52,783,798.66 |
| **පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය** | **148,445,781.54** | 162,147,775.66 |
| <u>ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය</u> | | |
| ආරම්භක තොගය | **11,060,668.09** | 7,845,074.52 |
| එකතු කළා :- ගැණුම් | **29,620,417.91** | 28,528,948.12 |
| | **40,681,086.00** | 36,374,022.64 |
| අඩුකළා :- අවසාන තොගය | **12,718,626.72** | 11,060,668.09 |
| **පරිභෝජනය කළ ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය** | **27,962,459.28** | 25,313,354.55 |
| සෘජු ශ්‍රම වියදම් | **64,913,760.81** | 62,871,840.95 |
| ආරම්භක දැව්තෙල් තොග | **859,917.50** | 969,076.00 |
| වෙනත් සෘජු වියදම් | **13,664,298.00** | 13,714,445.00 |
| අඩුකළා :- අවසාන දැව්තෙල් තොග | **834,400.00** | 859,917.50 |
| | **78,603,576.31** | 76,695,444.45 |
| **ප්‍රාථමික පිරිවැය** | **255,011,817.13** | 264,156,574.66 |
| <u>කම්හල් පොදුකාර්යය පිරිවැය</u> | | |
| එකතුකළා :- ආරම්භක නොනිමි | **14,875,406.97** | 12,646,762.16 |
| චක්‍ර වියදම් | **52,084,808.97** | 46,097,771.88 |
| අඩුකළා :- හානි වු නොනිමි තොග | **1,258,599.95** | |
| අඩුකළා :- අවසාන නොනිමි | **6,090,466.61** | 14,875,406.97 |
| | **59,611,149.38** | 43,869,127.07 |
| **වර්ෂයේ මුළු නිෂ්පාදන පිරිවැය වෙළඳ ගිණුමට ගෙන ගියා** | **314,622,966.51** | 308,025,701.73 |

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| විකුණුම් | **566,362,580.57** | 519,887,807.59 |
| අඩුකළා :- විකුණුම් පිරිවැය | **330,877,537.08** | 284,693,642.15 |
| **දළ ලාභය** | **235,485,043.49** | 235,194,165.44 |
| වෙනත් ආදායම් | **7,177,197.10** | 5,994,279.01 |
| | **242,662,240.59** | 241,188,444.45 |
| අඩුකළා :- ආයතන හා පරිපාලන වියදම් | **124,876,303.27** | 112,568,535.28 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | **64,696,190.94** | 62,306,790.48 |
| | **189,572,494.21** | 174,875,325.76 |
| **ක්‍රියාකාරකම් වලින් ලද ලාභය** | **53,089,746.38** | 66,313,118.69 |
| ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම | **(4,608,305.18)** | (4,159,786.50) |
| බදු අඩුකිරීමට පෙර ලාභය | **48,481,441.20** | 62,153,332.19 |
| අඩුකළා :- ලාභය මත බදු වෙන්කිරීම් | **12,850,474.88** | 21,095,256.19 |
| **බදු පසු ශුද්ධ ලාභය** | **35,630,966.32** | 41,058,076.00 |
| **අඩුකළා :- ලාභාංශ බදු** | **7,962,257.00** | |
| | **27,668,709.32** | 41,058,076.00 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | |
| පාරිතෝෂික ආයුගණන ලාභය/(ආලාභය) | **3,781,937.66** | 1,182,470.99 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | **3,781,937.66** | 1,182,470.99 |
| **වර්ෂයේ ලාභය** | **23,886,771.66** | 42,240,546.99 |

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2016.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු** | | |
| බදුපෙර ලාභය | **48,481,441.20** | **62,153,332.19** |
| **ගැලපීම්** | | |
| විවිධ වෙන්කිරීම් | **807,892.00** | **(1,826,268.00)** |
| වත්කම් ක්ෂයවීම් | **15,660,221.00** | **10,033,085.47** |
| **භාණ්ඩාගාර ප්‍රතිපාදන (ක්ෂය වීම)** | **(6,532,334.42)** | **(4,997,440.46)** |
| **බොල්ණය සඳහා වෙන්කිරීම්** | **-** | **2,493,761.14** |
| පාරිතෝෂික දීමනා ගැලපීම් | | **5,140,687.33** |
| පෙර වර්ෂයේ ගැලපීම් | **5,576,393.52** | **52,320,542.12** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ලාභය** | **64,018,613.30** | **125,317,699.79** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම** | | |
| තොග (වැඩිවීම) / අඩු විම | **46,943,188.79** | **(51,463,227.15)** |
| මාර්ගස්ථ තොග (වැඩිවීම) /අඩු විම | **-** | **-** |
| සේවක ණය (වැඩිවීම) / අඩු විම | **(533,059.86)** | **677,913.39** |
| කලින් ගෙවීම් හා අත්තිකාරම් (වැඩිවීම) /අඩු විම | **358,029.50** | **5,837,748.76** |
| විවිධ තැන්පත් (වැඩිවීම) / අඩු විම | **70,000.00** | **18,000.00** |
| ණයගැතියෝ (වැඩිවීම) / අඩු විම | **(31,328,960.39)** | **(39,041,834.77)** |
| ණයහිමියෝ වැඩිවීම / (අඩු විම) | **2,216,278.61** | **3,826,779.02** |
| ගිණුම්කරණ පැකේජයේ වෙනස වැඩිවීම / (අඩු විම) | **-** | **(38,613,358.30)** |
| ඉදිරි වර්ෂයට ලැබීම් වැඩිවීම / (අඩු විම) | **225,000.00** | **(80,000.00)** |
| ගෙවිය යුතු තැන්පත් වැඩිවීම / (අඩු විම) | **(1,792,865.28)** | **2,201,489.88** |
| උපචිත වියදම් වැඩිවීම / (අඩු විම) | **(417,746.62)** | **3,437,115.47** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ලාභය** | **79,758,478.05** | **12,118,326.09** |
| අඩුකළා :- පාරිතෝෂික දීමනා ගෙවීම | **(6,679,931.31)** | **(2,204,667.50)** |
| බදු ගෙවීම | **(22,757,878.84)** | **(5,830,826.71)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **50,320,667.90** | **4,082,831.88** |
| **ආයෝජන කටයුතු** | | |
| ස්ථාවර වත්කම් වෙනස් වීම | **(8,653,276.57)** | **(52,537,737.50)** |
| නොනිමී වැඩ වෙනස් වීම | **(27,846,634.61)** | **(10,923,014.72)** |
| ස්ථාවර තැන්පතු වෙනස් වීම | **(2,499,665.15)** | **(2,058,509.78)** |
| මාජින් ගිණුමේ වෙනස් වීම | **-** | **(1,584,156.14)** |
| අනේවාසික විදේශ විනිමය ගිණුමේ වෙනස් වීම | **(61,907.21)** | **(93,289.07)** |
| **අයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(39,061,483.54)** | **(67,196,707.21)** |
| **මූල්‍ය කටයුතු** | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | **50,000,000.00** | **16,000,000.00** |
| බැංකු ණය, පොළී ආපසු අයකර ගැනීම | **(6,337,999.92)** | **7,105,500.05** |
| ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල | **8,755,000.00** | **15,000,000.00** |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **52,417,000.08** | **38,105,500.05** |
| මුදල් හා මුදල් හා සමාන දෑ අතර ශුද්ධ වෙනස් වීම | **63,676,184.44** | **(25,008,375.28)** |
| **2016.01.01 මුදල් හා මුදල් හා සමාන දෑ** | **153,139,964.65** | **178,148,339.93** |
| **2016.12.31 මුදල් හා මුදල් හා සමාන දෑ** | **216,816,149.09** | **153,139,964.65** |

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-182315453 | **41,427,139.71** | **43,238,051.70** |
| මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-272315453 | **52,548,471.52** | **11,888,029.88** |
| ලංකා බැංකුව-ආයතන ශාඛාව-ගි.අ .00001209 | **121,175,537.86** | **96,888,883.07** |
| ඉතිරි කිරීමේ ගිණුම | **1,665,000.00** | **1,125,000.00** |
| | **216,816,149.09** | **153,139,964.65** |

## 2016 ස්කන්ධය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය
## (STATEMENT OF CHANGES IN EQUITY FOR 2016)

| විස්තරය | දායක ප්‍රග්ධනය | මහා භාණ්ඩාගාරය | ලෝක සෞඛ්‍ය සංවිධානය | අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | පරිසණක පැකේජය අනුව සංචිතය | විදේශ විනිමය සමකිරීමේ සංචිතය | ලාභලාභ ගිණුම | අනෙකුත් විස්තීරණ ලාභ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| 2016.01.01 දිනට ශේෂය | 5,000,000 | 254,630,369 | 3,994,341 | 761,274 | 1,923,741 | 3,873,560 | - | 19,523 | 382,463,694 | - | 652,666,502 |
| වර්ෂය තුල ගැලපීම් | - | 43,467,666 | - | - | - | - | - | - | 22,909,682 | | 66,377,347 |
| 2016.12.31 දිනට ශේෂය | 5,000,000 | 298,098,035 | 3,994,341 | 761,274 | 1,923,741 | 3,873,560 | - | 19,523 | 405,373,376 | - | 719,043,849 |

## ගිණුම් සටහන් (NOTE TO ACCOUNTS)

1. 2016.12.31 දිනට සංස්ථාවේ තොග තත්වය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | අමුද්‍රව්‍ය තොගය (පිරිවැය) | රු.30,991,179.12 |
| 2. | නිමි ඖෂධ තොගය (පිරිවැය) | රු.83,889,374.37 |
| 3. | ඇසුරුම් තොගය (පිරිවැය) | රු.12,718,626.72 |
| 4. | නොනිමි තොගය ( පිරිවැය) | රු.6,090,466.61 |
| 5. | ලිපිද්‍රව්‍ය තොගය (පිරිවැය) | රු.208,498.37 |
| 6. | දැව්තෙල් තොගය ( පිරිවැය) | රු.834,400.00 |
| 7. | යන්ත්‍ර අමතර කොටස් තොගය | රු.371,235.00 |

2. 2016.12.31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා විගණන ගාස්තු වශයෙන් රු. 650,000.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

3. 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට සහ 2011 අංක 22 දරණ දේශීය ආදායම් සංශෝධන පනතට අනුව සංස්ථාවේහි මෙහෙයුම් ලාභය 28%ක අනුපාතයකින් ආදායම් බදු වලට යටත් වේ.

| | 2015 (රු.) |
|---|---|
| ප්‍රවර්ථන වර්ෂයේ ලාභය මත බදු | 10,724,443.88 |
| විලම්භිත බදු | 2,126,031.00 |
| | 12,850,474.88 |

4. පහත දැක්වෙන නඩු ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ශවකරුවෙකු කරගෙන විභාග වෙමින් පවති.

| පාර්ශවය | තනතුර | නඩු අංකය | අධිකරණය | චෝදනා ස්වභාවය |
|---|---|---|---|---|
| එම්.කේ.සෝමදාස මයා | ගබඩා පාලක | W/P/HCCRMT/78/07 F | ශ්‍රේෂ්ඨාධිකරණය | අවු.55න් විශ්‍රාම යැවීම. |
| ආර්.එම්. ලංකාතිලක මයා | ආරක්ෂක නිලධාරි | HC3755/07 | මහාධිකරණය - කොළඹ | ජංගම අලෙවි මුදල් වංචාව |

5. ආනයනික අමුද්‍රව්‍ය හා යන්ත්‍ර අමතර කොටස් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව හා මහජන බැංකුව ගංගොඩවිල ශාඛාව සමඟ ණයවර ලිපි මඟින් ගිවිසුම් වලට එළඹ ඇත.

6. සංස්ථාවේ රත්‍රං තොගය 2016.12.31 දිනට රු.3,912,464.55 කර ගිණුම් ගත කර ඇත. එහි ඇති ප්‍රකාශිත ලාභය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රත්‍යාගත ලාභය ලෙස ගිණුම්වල පෙන්වා ඇත.

7. විකුණුම් වලින් ගිණුම් වල පෙන්නුම් කරනු ලබන්නේ දළ විකුණුම් වලින් වට්ටම් අඩු කළ පසු ශුද්ධ විකුණුම් වේ.

8. ගබඩා අංක 01 / 02 හා අංක 11 ගබඩා වල ඖෂධ නිෂ්පාදනාගාරයක අත්‍යාවශයෙන්ම තිබිය යුතු මිල කල නොහැකි කෞතුක ඖෂධ වර්ග රාශියක් පවතියි. ඒවායේ වටිනාකම ගිණුම් වල ගැලපීම් කර නොමැති අතර ඒකක වශයෙන් 2016.12.31 වන දිනට පහත දැක්වේ.

| | | |
|---|---|---|
| i. | මුතු සිප්පි කිලෝ | 86.35 |
| ii. | මුව අං කිලෝ | 52.10 |
| iii. | කස්තුරි ගුලි | 23.00 |
| iv. | ශුද්ධ කිරිගරුඬ කිලෝ | 4.46 |
| v. | දැලි පොතු කිලෝ | 3.00 |
| vi. | රිදී තුත්තනායගම් කිලෝ | 18.50 |
| vii. | සුදු ඊයම් කිලෝ | 16.80 |
| viii. | පිත්තල තහඩු කිලෝ | 2.50 |

9. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ඔසු ගොවි ව්‍යාපෘති කිහිපයක් සංස්ථාවට තාවකාලිකව භාර දී ඇත. ඒවායේ වත්කම් සංස්ථාව තාවකාලිකව භාරගෙන ඇති අතර දැනට ඔසු ගොවි ව්‍යාපෘති සඳහා වැය දැරීම් සංස්ථාව විසින් සිදු කරනු ලබයි. ඒවායේ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත.

10. සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා අධිකරණ හා උසාවි වලින් පරිත්‍යාග වශයෙන් ලැබෙන අමුද්‍රව්‍ය, ඒවායේ වටිනාකම පවත්නා වර්ෂයේ ටෙන්ඩර් අවම මිල යටතේ ගණනය කර, සංස්ථාවේ විවිධ ආදායම් ලෙසත් අමුද්‍රව්‍ය ගැණුම් ලෙසත් ගිණුම් වල ගැලපීම් කර ඇත.

11. දේශීය වෛද්‍ය අමාත්‍යංශය සතුව පවතින LC 9184 දරණ ලොරි රථය සංස්ථාවේ ඖෂධ බෙදා හැරීම සඳහා සේවයේ යොදවා ඇත.ඊට අමතරව පහත සඳහන් වාහනද සංස්ථාවේ රාජකාරි කටයුතු සඳහා භාවිතයට යොදවා ඇත.

PA – 7161

PA – 7155

GD – 7261

62 – 2440